# 2026 මැයි  මාසයට අදාලව 2026.05.15 වන දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව.

**දිනය** - 2026.05.15
**වේලාව** - පෙ.ව. 9.30
**ස්ථානය** - බිබිල ප්‍රාදේශීය සභාවේ සභා රැස්වීම් ශාලාව.

**සහභාගිත්වය -**

| | | |
|---|---|---|
| 01. වී. සරත් විදානගම මැතිතුමා | - | ගරු සභාපති |
| 02. එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා | - | ගරු උප සභාපති |
| 03. ආර්.බී. අත්තනායක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 04. ඩබ්.එම්. රූපසේන මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 05. බී.එම්. වීරසේකර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 06. ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 07. ඩී.එම්. ශ්‍රියානි මංගලිකා ජයලත් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 08. ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 09. පී. ජයන්ති මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 10. ඒ. එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 11. ඒ. එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 12. පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 13. එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 14. කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 15. ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 16. එල්.ඒ.බී. චින්තිකා හර්ෂනි මැතිතුමිය | - | ගරු මන්ත්‍රී |
| 17. ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා | - | ගරු මන්ත්‍රී |
| 18. ජේ.ඒ.ජී. විජේන්ද්‍රනාත් වර්ණකුලසූරිය මැතිතුමා | - | ගරු මන්ත්‍රී |

## (අ). පසුගිය මාසයේ සභා රැස්වීමේ වාර්තාව සභා සම්මත කිරීම.

ගරු සභාපතිතුමා විසින් මූලාසනය හොබවන ලද අතර 2026.04.21 දින පවත්වන ලද මහ සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රී මණ්ඩලය  වෙත 2026.05.11 වන දින  යොමුකර ඇති බැවින් එම වාර්තාව මෙම සභාවේ කියවූවා සේ සලකා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් වාර්තාවේ  සංශෝධන කිසිවක් ඇත්නම් ඒවා ඉදිරිපත් කරන ලෙසත් මූලාසනය විසින්  ගරු සභාවට දන්වන ලදි.

ගරු මන්ත්‍රී ඩබ් .එම්. රූපසේන  මැතිතුමා  විසින්  2026.04.21 දින පවත්වන ලද මහ සභා රැස්වීම් වාර්තාව සභා  සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කරන ලදී.

එම යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර  මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**සංශෝධන -**

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා</u>

(ඉ).01.17. යෝජනාවේ සඳහන් බිබිල නගරයේ අංක 01 කඩ කාමරයේ පවත්වාගෙන යනු ලබන එළ ගවමස් ව්‍යාපාරය අංක 02 කඩ කාමරයට මාරු කිරීම සම්බන්ධවයි යන්නෙහි **අංක 02 කඩ කාමරයට** ලෙස නොව අංක **01 කුකුල් මස් වෙළඳසැලට** ලෙස සංශෝධනය වියයුතු බව පැවසීය.

**ගරු මන්ත්‍රී එම්.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා**

(ඉ).01.05. යෝජනාවේ ගරු මන්ත්‍රී ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමාගේ **පුස්තකාලයේ ,පෙර පාසලේ** යන්නට **කොටගම පුස්තකාලයේ හා මූදියල පෙර පාසලේ** ලෙස ඇතුළත් වියයුතු බව පැවසීය.

ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා සංශෝධන සහිත 2026.04.21 දින පවත්වන ලද මහ සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරීමේ යෝජනාව ඉදිරිපත් කළ අතර එම යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඒ අනුව 2026.04.21 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ සංශෝධිත වාර්තාව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා පෙ.ව. 9.40 ට සභා ගර්භයට පිවිසෙන ලදී.

## (ආ).සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.

### (ආ).01. 2027 වර්ෂයේ අයවැය ලේඛනය පිළියෙල කිරීම.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168 (1) වගන්තිය ප්‍රකාරව නියම කර ඇති පටිපාටිය අනුව ඉදිරි වර්ෂය සඳහා බිබිල ප්‍රාදේශීය සභාවට අදාලව අයවැය ලේඛනයක් පිළියෙල කිරීම සිදුකළ යුතුව ඇත.

ඒ අනුව අයවැය රීති 6 (1) ප්‍රකාරව ඉදිරි වර්ෂයේ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුවට ඇතුළත් කිරීමට අදාල සංවර්ධන යෝජනා 2026 ජූනි මස 30 දිනට පෙර පහත ආකෘතිය අනුව සකස්කර ලබා දෙන මෙන් නිවේදනය කරන ලදී.

| අනු අංකය | මාර්ග සම්බන්ධ සංවර්ධන යෝජනා | පොදු සේවා සම්බන්ධ සංවර්ධන යෝජනා(නල ළිං-පෙරපාසල් - බහුකාර්ය ගොඩනැගිලි-පෙර පාසල් ආදි) |
|---|---|---|
| | | |

### (ආ).02. වාර්ෂික වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු සමීක්ෂණය - 2026

බිබිල ප්‍රාදේශිය සභාවේ සේවයේ නියුතු ආදායම් පරීක්ෂක ආර්.එම්.සී.යූ.කේ.රත්නායක මහතා 2026.05.10 දින දක්වා වාර්ෂික වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු සමීක්ෂණයක් සිදු කර තොරතුරු පහත පරිදි දක්වා ඇත.

| | |
|---|---|
| 01.2026.01.01 දින සිට 2026.01.14 දින දක්වා | - රු. 199,800.00 |
| 02.2026.01.15 දින සිට 2026.02.10 දින දක්වා | - රු. 165,680.00 |
| 03.2026.02.11 දින සිට 2026.03.10 දින දක්වා | - රු. 314,800.00 |
| 04.2026.03.11 දින සිට 2026.04.10 දින දක්වා | - රු. 370,880.00 |
| 05.2026.04.11 දින සිට 2026.05.10 දින දක්වා | - රු. 282,840.00 |
| | රු. 1,334,000.00 |

අදාළ ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව හා ගරු සභාවට දැන ගැනීම සඳහා නිවේදනය කරන ලදී.

**(ආ).03. වාර්ෂික දැන්වීම් පුවරු සමීක්ෂණය - 2026**

බිබිල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු ආදායම් පරීක්ෂක ආර්.එම්.සී.යූ.කේ.රත්නායක මහතා 2026.04.10 දින දක්වා වාර්ෂික දැන්වීම් පුවරු සමීක්ෂණයක් සිදු කර තොරතුරු පහත පරිදි දක්වා ඇත.

| | |
|---|---|
| 01.2026.01.01 දින සිට 2026.01.14 දින දක්වා | - රු. 223,950.00 |
| 02.2026.01.15 දින සිට 2026.02.10 දින දක්වා | - රු. 235,400.00 |
| 03.2026.02.11 දින සිට 2026.03.10 දින දක්වා | - රු. 383,500.00 |
| 04.2026.03.11 දින සිට 2026.04.10 දින දක්වා | - රු. 315,000.00 |
| 05.2026.04.11 දින සිට 2026.05.10 දින දක්වා | - රු. 217,550.00 |
| | රු.137,5400.00 |

අදාළ ගාස්තු අය කර ගැනීමට කටයුතු කරන බව හා ගරු සභාවට දැන ගැනීම සඳහා නිවේදනය කරන ලදී.

**(ඇ).ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.**

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා

මහජන පෙත්සමක් හෝ පැමිණිල්ලක් නොව ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලයේ WhatsApp සමූහයේ සාකච්ඡා වූ විපක්ෂ නායක නමින් කාර්යාලයට ලිපියක් ලැබීම සම්බන්ධයෙන් බව පැවසීය. නවක මන්ත්‍රී මණ්ඩලය මේ පිළිබඳව අවබෝධයක් නොමැති බැවින් අවබෝධය ලබාදීමට තමා ප්‍රාදේශීය සභාවේ පළමු පිළිගැනීමේ සභා වාරයේදී සිදුකළ කතාවේ දී විපක්ෂ නායක ලෙස තනතුරක් නැති බවත් මන්ත්‍රීවරුන් නොව සභිකයින් සිටින බවත් පනතේ සඳහන් බව තමාම කියූ බවත් පැවසීය. මෙම ලිපිය තමාට ලැබුණු එකක් යැයි පවසා ලබා නොගත් බවත් සභා ලේකම් තුමිය විසින් තමා හට ලබා දුන් බවත් පැවසූ අතර එය නිර්නාමිකව ගරු අග්‍රාමාත්‍යතුමියට යැවූ ලිපියක පිටපතක් බවත් එම ලිපියෙහි පිටපතක් ගරු සභාපතිතුමාටත් ලබා දී ඇති බවත් පැවසීය.

2012 වර්ෂයේ සිට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙකු ලෙස බිබිල ප්‍රාදේශීය සභාව නියෝජනය කරන තමන් ප්‍රාදේශීය සභාව සභා පනත වගේම කිසියම් සම්ප්‍රදායක් සහිතව ක්‍රියාත්මක වන බව පැවසූ අතර මෙම විපක්ෂ නායක යන තනතුර රාජ්‍ය ආයතනද පිළිගෙන ලිපි එවන බවත් ඒ සඳහා උදාහරණයක් ලෙස දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට සහභාගිවන ලෙස දිස්ත්‍රික් ලේකම් ලිපි එවනු ලබන්නේ ගරු සභාපතිවරයාට හා විපක්ෂ නායක වරයාට සහභාගි වන ලෙසින් බවත් එහි සමාලෝචන වාර්තාවන්ද විපක්ෂ නායක වරයාට ද ලබා දෙන බවයි.එසේම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවටද විපක්ෂ නායක වරයාට සහභාගි වන ලෙස රාජ්‍ය ආයතන මගින් දන්වන බව පැවසීය.

අවුරුදු 32ක කාලයක් ගුරුවරයෙකු ලෙස සේවය කළ බවත් පාසලේ තනතුරු දරා ඇති බවත් ස්වෙච්ඡා සංවිධානවල තනතුරු දරා ඇති බවත් එබැවින් තනතුරු පිළිබඳව තමා කිසිසේත්ම තණ්හාවක් නොමැති බව පැවසීය. ගරු සභාපතිතුමා , උප සභාපතිතුමා , මන්ත්‍රී මණ්ඩලය හා සභා ලේකම්තුමිය ඇතුළු නිළධාරි මණ්ඩලයේ කිහිප දෙනෙකු මෙම WhatsApp සමූහය තුළ සාමාජිකයින් බවත් මෙවැනි සමූහයක් තුළ මෙවැනි පණිවුඩ දැමීම පිළිබඳව තමා කණගාටුව ප්‍රකාශ කරන බව පැවසීය.

විපක්ෂ නායක තනතුර ලෙස තනතුරක් නොමැති වුණත් පකෂ කිහිපයකින් යුක්තව විපක්ෂයක් මෙම ප්‍රාදේශීය සභාව තුළ පවතින බවත් අවශ්‍ය අවස්ථාවක අවශ්‍ය වේලාවට නායකත්වය ගෙන සභාව තුළ කටයුතු කිරීමට සිදුවන බව පැවසීය. බිබිල ප්‍රාදේශීය සභාවේ විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු 08 දෙනා කිසිම අවස්ථාවක ගරු සභාපතිතුමා හා සභාව අපහසුතාවයට පත්වන ආකාරයේ කටයුතු සිදු නොකරන බවත් මහජනතාව වෙනුවෙන් ගනු ලබන අයහපත් තීරණවලට විරුද්ධව ඡන්දය භාවිත කිරීමටත් , ජනතා අභිවෘද්ධිය වෙනුවෙන් ගනු ලබන නිවැරදි තීරණ සඳහා සහයෝගය ලබා දෙමින් සභා කටයුතු සඳහා සහයෝගය ලබා දීමට බැඳී සිටින බව පැවසීය. එසේම විවිධ මාධ්‍ය සංදර්ශන පවත්වමින් සභාවේ නොහැසිරෙමින්, බුද්ධිමත් ලෙස විපක්ෂ මන්ත්‍රීවරු හැසිරෙන බවත් පැවසීය. පාර්ලිමේන්තුවේ මෙන්ම පළාත් පාලන ආයතනය තුළ බහුතර බලයක් සහිතව ජාතික ජනබලවේගයට ආණ්ඩු බලයක් පවත්නා බවත් එය වෙනස් කර අපගේ විපක්ෂයට ආණ්ඩු බලයක් ලබා ගැනීමට අවශ්‍ය නොවන බවත් පැවසූ අතර පවත්නා ආණ්ඩුවට සමගාමීව පළාත් සභා , පළාත් පාලන ආයතනවල බලය පිහිටුවනු ලබන බැවින් මෙම විපක්ෂයට ගරු සභාපතිතුමාට හෝ මන්ත්‍රී මණ්ඩලයට ගැටලු ඇති කරමින් කටයුතු නොකරන බවත් දේශපාලනික වශයෙන් විවිධ පක්ෂ නියෝජනය කළද බිබිල ප්‍රදේශයේ පදිංචිකරුවන් වන මෙම සියළු මන්ත්‍රීවරු අපේකම රැකගෙන බැඳීමකින් යුතුව කටයුතු කළයුතු බවත් WhatsApp සමූහය තුළ ඉදිරියේ දී හෝ මෙවැනි අදහස් හුවමාරු කිරීම් සිදුකර ගැනීමෙන් වැළකී බුද්ධිමත් මන්ත්‍රීවරුන් ලෙස කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින් පක්ෂයේ අත්‍යාවශ්‍ය කාරණාවක් සඳහා සහභාගිවීමට සමගි ජනබලවේගය නියෝජනය කරන මන්ත්‍රී මණ්ඩලයට සභා ගර්භයෙන් පිටව යැමට ගරු මූලාසනයෙන් අවසර ඉල්ලා සිටින ලදී.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

මේ සම්බන්ධයෙන් කණගාටුව ප්‍රකාශ කළ ගරු මූලාසනය, සභා පනත තුළ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු හා විපක්ෂ නායක ලෙස ඇතුළත් නොවුණද සමාජයේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු හා විපක්ෂ නායක ලෙස මතයන් ගොඩනැගී සමාජගත වී ඇති බවත් ව්‍යවහාර වන බවත් රාජ්‍ය ආයතනවල පවා මෙම විපක්ෂ නායක යන තනතුර ව්‍යවහාර වන බව පැවසීය.

සභා පනත තුළ , මහ සභාව තුළ පක්ෂ විපක්ෂ ලෙස බෙදීමක් නොමැති බවත් බහුතර මන්ත්‍රීවරුන් සිටින පක්ෂය බලය හොබවන පක්ෂය ලෙස නම්කර ඇති බවත් පැවසූ අතර බිබිල ප්‍රාදේශීය සභාව තුළ ජාතික ජනබලවේගය බලය හොබවන බවත් පැවසීය. සෙසු පක්ෂ නියෝජනයන් මෙම සභාව තුළ පවතින බවත් ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරයෙක් ලෙස ගරු තිස්ස ගුණසිංහ මැතිතුමා පවසන පරිදිම එම පක්ෂයන් සභා කටයුතු වලට බාධා කරමින් කඩාකප්පල්කාරී ක්‍රියාවන් සිදු කරමින් නොහැසිරෙන බවත් සභාවේ උන්නතිය වෙනුවෙන් කටයුතු කරන බවත් සභාවේ සාධනීය යෝජනාවන් සඳහා සහයෝගය ලබා දෙමින් අපගේ යෝජනාවන් සඳහා විපක්ෂ මන්ත්‍රීවරුන්ට දැනෙන ආකාරයට විවේචන විරෝදතා එල්ල කරමින් සහයෝගයෙන් කටයුතු කරගෙන යන බව පැවසීය. මෙම WhatsApp සමූහයේ සිදුවූ තොරතුරු හුවමාරුව තුළත් මන්ත්‍රීවරුන් හට සිත්තැවුලක් සිදුවූයේ නම් කණගාටුව පලකළ අතර සමාජ මාධ්‍ය වල සිදුවන මෙවැනි දේවල් පිළිබඳව දරා ගනිමින් කටයුතු කළයුතු බව පැවසීය.

පෙ.ව.9.55 ට

- ගරු මන්ත්‍රී එම්.එම්. තිස්ස ගුණසිංහ මැතිතුමා
- ගරු මන්ත්‍රී කේ.ජී. උදය සඳරුවන් ජයසිංහ මැතිතුමා
- ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්ති ප්‍රියදර්ශනී සමරකොන් මැතිතුමිය
- ගරු මන්ත්‍රී එල්.ඒ.බී. චින්තිකා හර්ශනී මැතිතුමිය

සභා ගර්භයෙන් පිටව යන ලදී.

ගරු මන්ත්‍රී බී.එම්. වීරසේකර මැතිතුමා පෙ.ව.10.00 ට සභා ගර්භයට පිවිසෙන ලදී.

වරිපනම් බදුවලින් නිදහස් කර දෙන ලෙසට ඉල්ලීම් කර ඇති අඩු ආදායම්ලාභීන් 2026 වර්ෂයට වරිපනම් බදු ගෙවීමෙන් නිදහස් කිරීම සම්බන්ධව 2026 මාර්තු 19 වන දින (ඉ) 01.13 යෝජනාව

ඉදිරිපත් කර ඇත. ඒ පිළිබඳව ගරු සභාව විසින් "වරිපනම් බදු නිදහස් කර දෙන ලෙස ඉල්ලීම් කර ඇති අඩු ආදායම් ලාභීන් 2026 වර්ෂයට වරිපනම් බදු ගෙවීමෙන් නිදහස් කිරීම සඳහා ඉදිරිපත් කර ඇති නාම ලේඛනයෙහි ඇතුළත් පුද්ගලයින්ගේ දරිද්‍රතාවය පිළිබඳව නිවැරදි තොරතුරු ලබා දෙන ලෙස බිබිල ප්‍රාදේශීය ලේකම්තුමා වෙත ලිපියක් ඉදිරිපත් කිරීමටත් , ආදායම් පරීක්ෂක මහතාට මෙම නාම ලේඛනයේ සඳහන් පුද්ගලයින් දරිද්‍රතාවයෙන් පෙළෙන බැවින් බදු කපා හරින ලෙස සනාථ කළහැකි ලියවිලි සමඟ ඉදිරි මහ සභාවකට ඉදිරිපත් කරන ලෙස" තීරණය කර ඇත. නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත එවැනි ලිපියක් යැවීමෙන් එම ආයතනයේ එතුමා යටතේ සේවයේ යෙදෙන නිළධාරීන් පිළිබඳව අවතක්සේරුවක් ඇති වන බැවින් මන්ත්‍රී මණ්ඩලයේ කිහිප දෙනෙක් එක්ව මෙම අඩු ආදායම් ලාභීන් යැයි ඉදිරිපත් කර ඇති නාම ලේඛනයේ සඳහන් සියළු දෙනා පිළිබඳව සතියක පමණ ඉතා කෙටි කාලයකින් සමීක්ෂණයක් සිදුකර ඒ අයගෙන් සත්‍ය වශයෙන් ම දරිද්‍රතාවයෙන් පෙළෙන පුද්ගලයින් හඳුනාගෙන වරිපනම් 2026 වර්ෂය සඳහා කපා හැරීමට නැවත මහ සභාවකට ඉදිරිපත් කරන්නේ නම් සුදුසු බවත් ඒ සඳහා මන්ත්‍රී මණ්ඩලය සහයෝගය ලබා දෙන ලෙසත් දන්වා සිටින ලදී.

## (ඈ).යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.

කිසිවක් ඉදිරිපත් වී නොමැත.

## (ඉ).යථාපරිදි කල්දි ඇති යෝජනා.

## (ඉ).01.ගරු මූලාසනයේ යෝජනා.

### (ඉ).01.01. නාගරික සංවර්ධන අධිකාරිය මඟින් 2026 වසරේදී ක්‍රියාත්මක කිරිමට යෝජිත ව්‍යාපෘති.

ප්‍රවාහන, මහා මාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන "5 Million short Term UDA Projects" වැඩසටහන යටතේ බිබිල නගරයේ තානායම පිහිටි ඉඩමට යාබද බුබුල පිහිටි ඉඩමේ භූමි ප්‍රමාණය අලංකරණය හා නාගරික සෞන්දර්ය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියක් කිරීමට යෝජිතය .

මෙම ව්‍යාපෘතිය ගරු නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය එරංග ගුණසේකර මැතිතුමා වෙත 2026.03.31 දින ඉදිරිපත් කල අතර ,ව්‍යාපෘතිය සඳහා එතුමාගේ අනුමැතිය ලබා දෙන ලදි.

එබැවින් උක්ත ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සඳහා,

01.බිබිල ප්‍රාදේශිය සභාවේ , සභා අනුමැතිය,
02.ව්‍යාපෘතිය නිමකිරීමෙන් පසුව නඩත්තු කටයුතු සඳහා වන එකඟතාව

ආදිය පිළිබඳ තොරතුරු මෙම අධිකාරිය වෙත ලබා දීමට අවශ්‍ය බැවින් සාකච්ඡා කර තීරණයක් ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.02. මත්පැන් බලපත්‍රයක් ලබා ගැනිම සම්බන්ධවයි.**

උක්ත කරුණ සම්බන්ධව ලංකා සතොස, බිබිල කළමනාකරු වන එම්.ජී.ඩී.ජී. අබය ගුණවර්ධන මහතා විසින් 2025.05.26 දිනැතිව ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය මඟින් බිබිල සතොස අලෙවිසැලේ මත්පැන් අලෙවිසැලක් ආරම්භ කිරිමට සැලසුම් සකස් කරමින් සිටින බවත්, බිබිල සතොස අලෙවිසැලට මත්පැන් අලෙවි කිරිමට අවස්ථාවක් ලබා ගැනිම සඳහා මත්පැන් බලපත්‍රයක් ලබා ගැනිමට අවශ්‍ය සහය ලබා දී ඒ සඳහා අනුමැතිය ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලිම් කර ඇත.

ඒ අනුව 2026.04.21 මහ සභාවේදී සාකච්ඡා කළද තීරණයක් ගැනීම සඳහා ඉදිරි මහ සභාවට කල්තබා ඇත. එබැවින් සතොස කළමනාකරු විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම සම්බන්ධව තීරණයක් ගැනිමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා**

බිබිල නගරය පුරා මත්පැන් අලෙවිසැල් විශාල ප්‍රමාණයක් තිබෙන බැවින් සතොස තුළ මත්පැන් අලෙවි සැලක් ආරම්භ කිරීමට තමා පෞද්ගලිකව අකමැති බවත් එවිට මේ පිළිබඳව මාලිමා ආණ්ඩුවෙන් මත්පැන් අලෙවිසැලක් ආරම්භ කළායැයි මහජනතාව අතර මතයක් ගොඩනැගෙන බවත් පැවසීය. මෙහි මත්පැන් අලෙවිසැල ආරම්භ කරන්නේ නම් අයකරනු ලබන කුලී මුදල වැඩි කළයුතු බව පැවසීය. කෙසේ වුවද දරුවන් සමඟ දෙමව්පියන් මෙම අලෙවි සැලට පැමිණෙන බැවින් මෙහි මෙවන් ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවසර දීම සුදුසු නොවන බව පැවසූ අතර මෙම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක්ද ඉල්ලා සිටින ලදී.

**ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය**

පසුගිය ආණ්ඩු පාලන සමයන්හි වැඩි වූයේ මත්පැන් අලෙවිසැල් බවත් ඒ අය මේවා ආරම්භ කිරීමට පෙර පාසලට පන්සලට ඇති දුර ප්‍රමාණයන් පිළිබඳව සොයා නොබලා ඇති අතර මුදල් ඉපයීමට පමණක් මූලික කරගෙන ඇති බව පැවසීය. බිබිලේ මත්පැන් අලෙවිසැල් පවත්වාගෙන යනු ලබන්නේ ද්‍රවිඩ ජාතිකයින් බව ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්. වසන්තී ප්‍රියදර්ශනී සමරකෝන් මැතිතුමිය පැවසුවද මේවා ආරම්භ කිරීමට අවස්ථාව ලබා දුන්නේ කවුරුන්දැයි අසන ලදී.

දරු පරපුරේ බොහෝ දෙනෙක් මත්පැන් සඳහා ඇබ්බැහි වී ඇත්තේ මෙලෙස ආරම්භ කරනු ලැබූ මත්පැන් අලෙවි සැල් නිසා බවත් නීති විරෝධී ක්‍රියාවන් නැති කිරීමට පාලනය කිරීමට ජාතික ජනබලවේග ආණ්ඩුව පත්වී ඇති බැවින් මෙලෙස සියළු නීතිරීති උල්ලංඝනය කරමින් ආරම්භ කළ මත්පැන් අලෙවිසැල් තුරන් කිරීම සඳහා මේවා එකින් එක අඩු කිරීමට වසා දැමීමට කටයුතු කරමු යැයි පැවසීය.අපිට අවස්ථාව ලැබෙන සෑම අවස්ථාවකට මෙවැනි දේවලින් ඉවත්ව අනාගත දරු පරපුර මේවායින් මුදවා ගැනීමට කටයුතු කළයුතු බව පැවසීය.

තරුණ දරුවන් මොණරාගල හන්දිය ආසන්නයේ ඇති මත්පැන් අලෙවි සැලෙන් මත්පැන් බෝතල් රැගෙන කැළෑ මැදින් හොරෙන් යන අවස්ථා තමා දැසින් දැක ඇති බවත් එබැවින් දරුවන් මත්පැන්

සඳහා ඇබ්බැහිවීම වලක්වා ගැනීමට, මත්පැන් තුරන් කිරීමට කටයුතු කළයුතු බවත් පැවසූ අතර මෙම සතොස මත්පැන් අලෙවි සැල ආරම්භ කරන්න, නමුත් තමා පෞද්ගලිකව මත්පැන් අලෙවිසැල ආරම්භ කිරීමට අකමැති බවත් අප්‍රසාදය පල කරන බවත් තමා මේ පෙන්වා දෙනු ලබන්නේ මතින් සිදුවන ආදීනව බව පැවසීය. තමන්ට අවස්ථාව ලැබුණු සැණින් දූෂණය සාධාරණය වෙනුවෙන් නැගී සිටින බවත්, පොඩි දරුවෝ සමඟ පවුලේ සියළු දෙනා එක්ව සතොසට පැමිණෙන බවත් එබැවින් කීල්ස් , කාගිල්ස් වෙළඳසැල්වල මෙවැනි මත්පැන් අලෙවිසැල් පවත්වාගෙන යනවා යැයි පවසා සතොසෙත් මත්පැන් අලෙවිසැල් ආරම්භ කිරීමට අවශ්‍ය නොවන බවත් එම ආයතනවල ඒවා ආරම්භ කර ඇත්තේ ජනතාව විනාශ කිරීම සඳහා උපාය මාර්ගයක් ලෙසින් බවත් පැවසීය. දරු පරපුර ඩැහැ ගැනීම සඳහා ආරම්භ කළ ක්‍රමවේදයක් වූ මේවා උඩු යටිකුරු කර අවස්ථාව ලද පමණින් ක්ෂණිකව අදහස් ඉදිරිපත් කර තුරන් කිරීමට කටයුතු කළයුතු බව පැවසීය. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අත ඔසවා සහයෝගය ලබාදුනහොත් තමාගේ හෘද සාක්ෂියට එකඟ නොවන බවද තවදුරටත් පවසාලීය. තමාගේ කුඩා අවධියේද මෙම මත්පැන් නිසා තමාගේ පියාගෙන් බැට කා ඇති බවත් මෙම මත්පැන්වල ආදීනව හොඳින් හඳුනන බවත් ආණ්ඩු පක්ෂයේ යෝජනා සඳහා එහෙයියෝ නොවන බවත් විපක්ෂයෙන් එහෙයියෝ වන බව පැවසුවද මෙතෙක් තමන් එහෙයියන් නොවූ බවත් පැවසීය.

මෙම ක්‍රමය වෙනස් කිරීමට ගෙයින් ගෙට ගමින් ගමට ගොස් මේ තැනට පැමිණියේ සත්‍ය වෙනුවෙන් හඬ නගන්නට බව පැවසීය. වෛර දරමු , උත්සාහ කරමු, පොර බදිමු, සත්‍ය වෙනුවෙන් සැබෑව වෙනුවෙන් , අපේ සැබෑ ප්‍රායෝගික ලෝකයක් සැදිය යුතු බැවින් තමා මේ අවස්ථාවේ සැබෑවටම සංවේදී වන බවත් දරා ගැනීමටද නොහැකි තත්වයක්ද පවතින බවත් මේ සඳහා තමා අකමැත්ත ප්‍රකාශ කරන බවත් එබැවින් මන්ත්‍රී මණ්ඩලයේ කිසිම කෙනෙකු තමා පිළිබඳව වැරදි විදිහට සිතීමට හෝ විවේචනය නොකරන ලෙසද ඉල්ලා සිටින ලදී.

<u>ගරු සභාපති වී. සරත් විදානගම මැතිතුමා</u>

මේ වනවිට සමාජය විකෘති වී වෙනස් වී ඇති බවත් මත්පැන් වෙළඳසැල් පෝය දිනයන්හි වසා තබන නිසා ඊට පෙර දිනයෙහි දිගු පෝලිම් තිබෙන බව පැවසීය. සමාජ සත්භාවයෙන් යුතු සමාජයේ උන්නතිය වෙනුවෙන් කල්පනා කරන සමාජ සාධාරණත්වය වෙනුවෙන් පෙනී සිටින පොදු මහජනතාවට මෙම කාරණාව පිළිබඳව එකඟවීමට අපහසු වුවද බලපත්‍ර සහිත මත්පැන් ව්‍යාපාරය පවත්වාගෙන යාම සමාජයේ නීත්‍යානුකූලව බව පැවසීය.

මත්පැන් අලෙවිසැල් ආරම්භ කිරීමට අදාළ කොන්දේසිවලට යටත් වනවාදැයි ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව සොයා බලන බවත් එලෙසම පන්සලට ,පාසලට, අධිකරණයට පවතින දුර ප්‍රමාණයෙන් ද සැලකිල්ලට ගෙන සිදු කරන බැවින් අපි කලබල නොවියයුතු බව පැවසීය. මත්පැන් බලපත්‍ර ලබා නොදුන්නද සාමාන්‍ය ජනතාව නීති විරෝධී තිප්පොළවල් ආරම්භ කරගෙන නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය කරගෙන භාවිතා කරන බව පැවසීය. අම්මා, තාත්තා, අයියා, අක්කා, වැඩිහිටියන්, ගුරුවරු දරුවෙකුට උපදෙස් අනුශාසනා ලබාදී ප්‍රති නිර්මාණය කර සමාජගත කළද කාලයාගේ ඇවෑමෙන් ඔවුන් වෙනස් වන බව පැවසීය. ගරු මන්ත්‍රී අත්තනායක මැතිතුමා දෙමව්පියන් දරුවන් සමඟ සතොසට ගොස් මත්පැන් බෝතලයක් මිලදී ගැනීම සුදුසු නොවන බව පැවසුවද බොහෝ පියවරුන් මතපැන් පානය කර නිවෙස්වලට යන බවත් නිවසෙහි නොමනා ලෙස හැසිරෙන බවත් පැවසීය. කෙතරම් මානුෂීය වුවද කෙතරම් ආගමානුකූල වුවද පුද්ගලයෙකු නිර්මාණය විය යුත්තේ නිවසින්ම තම තමා විසින්ම බව පැවසීය.

තමා කෙතරම් මත්පැන් අලෙවිසැල් ඉදිරියෙන් ගියද මත්පැන් බොන ස්ථානයකට ගියද කොතරම් මුදලක් අතෙහි තිබුණද මත්පැන් පානය කිරීමට ආශාවක් නොසිතෙන බවත් එසේ නොගන්නා බවත් ඒ තමාගේ පෞර්ෂය බවත් පැවසූ අතර මත්පැනට ඇබ්බැහි වූවන් ගොඩනැගෙන්නේ මත්පැන් අලෙවිසැල් ආරම්භ කිරීමෙන් නොව පුද්ගලයාගේ අදහස් උදහස් වලින් බව පැවසීය. සතොස වෙළඳසැල් මඟින් සීල් කරන ලද මත්පැන් බොතල් අලෙවි කිරීමට අවසරය ලබා දුන්නාට තමාට කොමිස් නොලැබෙන බවත් මීට පෙර ආරම්භ කළ මත්පැන් අලෙවිසැල් වලින් පෙරසිටි පාලකයින්ට

කොමිස් කුට්ටි පිටින් ලැබුණු බවද පැවසීය. බිබිල ප්‍රදේශයේ දෙමළ ජාතිකයින් මත්පැන් අලෙවිසැල් පවත්වාගෙන ගියද බිබිල ප්‍රදේශයේ මත්පැන් අලෙවිසැල් ආරම්භ කිරීමට මුල්ම යෝජනාව සිදුකර ඇත්තේ සිංහල බෞද්ධ මන්ත්‍රීවරයෙකු බව පැවසීය. කිසියම් පුද්ගලයෙකු මත්පැන් බලපත්‍රයක් ඉල්ලා සිටියහොත් ජාතික ජනබලවේගයට ද එය නීත්‍යානුකූල වේනම් ලබා දිමට සිදුවන බව පැවසීය. එයට හේතුව ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී රටක් වීම බව පැවසීය. පැවති නීතිය වෙනස් කළ නොහැකි බවත් සමහර දේවල් අපි අකමැති වුවද අප්‍රසාදය පලකළද ප්‍රජාතන්ත්‍රවාදී සමාජය තුළ ඒවා සිදු කිරීමට සිදුවන බව පැවසූ අතර මෙම යෝජනාව සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සංවාදයේ නොයෙදී සභාවේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු මේ අවස්ථාවේ සභා ගර්භයේ නොමැති බැවින් ඡන්දයක් නොපවත්වා ඉදිරි මහ සභාවකට කල් තැබීමට සුදුසු බව පවසාලීය. තමන් පෞද්ගලිකව මෙම යෝජනාවට අකමැති නොමැති බවද වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව ඉදිරි මහ සභාවට කල් තබන ලදී.

ගරු පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා පෙ.ව.10.25 ට සභා ගර්භයට පිවිසෙන ලදී.

**(ඉ).01.03. 20 KVA ජෙනරේටරය සේවා වාර කිරීම හා පරීක්ෂාවට ලක් කිරීම සම්බන්ධවයි.**

බ්‍රවුන්ස් ආයතනය විසින් එවා ඇති 2026.02.12 දිනැති වාර්ෂික සේවා ගිවිසුමෙහි සඳහන් පරිදි බිබිල ප්‍රාදේශීය සභා කාර්යාලයේ ස්ථාපිත කර ඇති 20 KVA ජෙනරේටරය 2026.03.01 දින සිට 2027.03.01 දින දක්වා කාලයට සේවා කටයුතු සිදු කිරීම සඳහා රු. 153,400.00 ක සේවා ගාස්තුවක් අප ආයතනය විසින් ගෙවිය යුතු බවයි.

නමුත් 2026.03.19 දින පැවති මහ සභාවට එම යෝජනාව ඉදිරිපත් කළ පසුව වර්ෂයක කාලයක් තුල වාර සේවා කිරීමට වඩා භාවිතා කළ පැය ගණන පිළිබඳව අවබෝධයක් ලබාගෙන වාර්ෂික සේවාව සිදුකළ යුතු බවට තීරණය කර එම යෝජනාව මහ සභාව විසින් කල්තබා ඇත.

ඒ අනුව කළ පරීක්ෂා කිරීමේදී අදාල ලේඛණ අනුව අවසන් වරට වාර සේවා සිදුකර ඇති දිනයෙහි පැය ගණන 812 ක් ලෙස සටහන්ව ඇත. ඒ අනුව එතැන් සිට ඉදිරියට පැය 250 ක් ධාවනය වූ පසුව නැවත වාර සේවාවක් සිදු කිරීම සුදුසු බවට කාර්මික නිළධාරි විසින් යෝජනා කර ඇත. එබැවින් පැය 1062ක් භාවිතා කිරීමෙන් පසු වාර සේවාව සිදු කරන බව බ්‍රවුන්ස් ආයතනය වෙත දන්වා යැවීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.04. බිබිල සතිපොළ E කඩ කාමර සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවේ 2025.12.16 දිනැති මාසික සභා රැස්වීමේ අංක 05.01.15 අනුව

**"බිබිල සතිපොළ E කඩ කාමර 13,වසර 10ක් සඳහා බදු ලබා දිමටත් එම කඩ කාමරයක් සඳහා කී මනි මුදල රු.1,000,000.00 බැගින් අය කිරිමටත් ඒ සඳහා මාසික කුලිය රු.1700.00ක් ලෙස අය කිරිමටත් එම කඩ කාමර ලබා ගැනිමට කැමති නම් පැරණි බදුකරුවන් හට ඉදිරිපත් වන ලෙස ලිපි මඟින් දැනුම් දිමටත් මෙම කඩ කාමර ලබා ගැනිමට කැමති පැරණි බදුකරුවන් හට පළමුව බදු ලබා දීමටත් එසේ ලබා දී තවත් කඩ කාමර ඉතිරි වේ නම් ඉල්ලුම් කරනු ලබන නව බදුකරුවන් හට බදු ලබා දිමටත් මෙම කඩ කාමර සම්බන්ධයෙන් වසර 10කට බදු දීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරිමට හා තක්සේරු කිරිමට අනුමැතිය ලබා ගැනිමට හා එසේම ආණ්ඩුකාර අනුමැතියට යොමු කිරිම සඳහා ගිවිසුම් කෙටුම්පතද අවශ්‍ය බැවින් දැනට F ශ්‍රේණියේ කඩ කාමර සඳහා අත්සන් කරනු ලබන බදු ගිවිසුම් කෙටුම්පත ම E කඩ කාමර සඳහාද ගිවිසුම් ගත විමට භාවිත කිරිමට සුදුසු බවත් තීරණය කර ඇත."**

ඒ අනුව බිබිල සතිපොළ E කඩ කාමර 13 රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් පහත පරිදි තක්සේරු කර වාර්තාව එවා ඇත.

| අනු අංකය | කඩ කාමර අංකය | ආපසු නොගෙවන අතරුදවුම් මුදල රු. (එක කඩ කාමරයක් සඳහා) | ආපසු නොගෙවන අත රුදවුමු මුදලට යටත් මාසික කුලිය රු. (එක් කඩ කාමරයක් සඳහා ) |
|---|---|---|---|
| 01 | අංක 01 සිට 11 දක්වා කඩ කාමර (කඩ කාමර 11) | රු.114,000.00 | රු.1200.00 |
| 02 | අංක 12 සිට 13 දක්වා කඩ කාමර (කඩ කාමර 02) | රු. 150,000.00 | රු. 1650.00 |

සම්මත අතුරු ව්‍යවස්ථාවේ ද 41 වගන්තියේ (iii) හි පහත පරිදි සඳහන් වේ.

"පැරණි වෙළඳපොළ ගොඩනැගිල්ලක් ඉවත් කර එම ස්ථානයෙහිම නව වෙළඳසැල ඉදිකර ඇති අවස්ථාවකදී පැරණි වෙළඳසැලෙහි බදුකරුවන් විසින් නව වෙළඳසැලෙහි කඩ කාමර ඉල්ලා සිටින්නේ නම් සභාව විසින් නියම කරන එකවර ගෙවන මුදලක් හා 31 (ii) වගන්තිය යටතේ නියම කළ මාසික බදු කුලිය මෙන් තුන් ගුණයකට සමාන මුදලක් සභාව නියම කරන දිනයකට පෙර සභාවට ගෙවා 32 වගන්තියෙහි සඳහන් ගිවිසුමට එළඹෙන්නේ නම් තරඟකාරි ටෙන්ඩර් කැඳවීමකින් තොරව කඩ කාමර බදු අයිතිය පවරා දිය හැකිය."

එබැවින් E කඩ කාමර බදු ලබාගෙන සිටි පැරණි බදුකරුවන්ගේ නාම ලේඛනය පහතින් ඉදිරිපත් කරන අතර රජයේ තක්සේරුකරු විසින් එවන ලද තක්සේරු වාර්තාව අනුව අදාල කී මනි මුදල ගෙවා කඩ කාමර ලබා ගැනිමට එම අයට හැකියාව ඇති බැවින් ඒ සඳහා ඉදිරිපත් වන ලෙස දන්වා ලිපි යැවිමට කටයුතු කිරිම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| **සතිපොල කඩ කාමර අංකය** | **බදුකරුගේ නම** | **ලිපිනය** |
|---|---|---|
| E 01 | ඩබ්.ඇම්.ගුණසිරි මයා | කිවුලපිටලන්ද,බිබිල |
| E02 | එම්.බී.නන්දාවති | කිවුලපිටිලන්ද,බිබිල |
| E03 | උපාලි විජේහේවා මයා | මහියංගන පාර,බිබිල |

| | | |
|---|---|---|
| E04 | ආර්.ඩබ්.එම්.ස්වර්ණපාල මයා | කිවුලපිටලන්ද,බිබිල |
| E 05 | එස්.ජේ.ඒම්.සුමනාවති මිය | 01 කණුව,මහියංගන පාර,බිබිල |
| E 06 | සුමනා විජේවර්ධන මිය | කිවුලපිටලන්ද,බිබිල |
| E 07 | කේ.කේ.දුමින්ද මයා | මඩකලපුව පාර,බිබිල |
| E 08 | ඒ.ආර්.ගුණරත්න මැණිකේ මිය | බදුල්ලගම්මන,හෙල්ලිවත්ත,බිබිල |
| E 09 | ආර්.එම්.සරත් මයා | වැගම,බිබිල |
| E 10 | ආර්.එම්.පුංචිබණ්ඩා මයා | 02 කණුව,වැගම,බිබිල |
| E 11 | ඊ.එම්.ධර්මසේන මයා | අංක 10,දම්පතිගම,බිබිල |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

මෙම යෝජනාව 2025 දෙසැම්බර් 16 දින මහ සභාවේ සාකච්ඡා වී ඇති බැවින් මාස 06ක් මේ වන විට ඉකුත්ව නැති බැවින් මෙම යෝජනාව සඳහා ලැබුණු තීරණය වෙනස් කළ නොහැකි බැවින් 2026 ජුනි 16 දිනෙන් පසුව තීරණයක් ගැනීමට හැකි බැවින් ඉදිරි මහ සභාවට ඉදිරිපත් කළයුතු බව පැවසීය. මෙම යෝජනාව ඉදිරි මහ සභාවට ඉදිරිපත් කර අප විසින් ලබාගෙන ඇති තීරණය ලබා ගනිමු. මෙම කඩකමරය ලබා ගැනීමට කැමති අයෙකු සිටී නම් බදු ගැනීමට ඉදිරිපත් වනු ඇතැයි පැවසීය.

මෙම යෝජනාව ඉදිරි මහ සභාවට ඉදිරිපත් කර මෙම E කඩ කාමර වල බදු මුදල් අඩු වැඩි කිරීමට කටයුතු කරන බවත් ආණ්ඩුකාරතුමා අනුමැතිය ලබාදී ඇති අවුරුදු 10 සඳහාම ටෙන්ඩර් කිරීමත් ගාස්තු සංශෝධනය කිරීම සඳහා යකඩ වැට ,දොරවල් සවි කිරීම හා ඉතිරි වැඩ නිම කිරීම සඳහා යන වියදම් ඇස්තමේන්තු සකස් කර ඒ අනුව කීමනි හා මාසික කුලිය තීරණය කරමු යැයි පැවසීය. ඊළඟ මහ සභාවේදී පුළුල්ව සාකච්ඡාවට භාජනය කරන බවද තව දුරටත් පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව ඉදිරි මහ සභාවට කල් තබන ලදී.

## <u>(ඉ).01.05. බිබිල පොදු වෙළඳපොළ A 16 කඩ කාමරය සම්බන්ධවයි.</u>

බිබිල ප්‍රාදේශිය සභාව සතු බිබිල පොදු වෙළඳපොළ A 16 කඩ කාමරය සුන්දර බේක් හවුස්, පොදු වෙළඳපොල, බිබිල ලිපිනයෙහි එච්.එම්.කරුණාසුන්දර යන අය විසින් බදු ලබා ගෙන ඇත. 2022 වර්ෂයේ දෙසැම්බර් මාසයේ මෙම කඩ කාමරයේ බිත්ති පුපුරා ගොස් අබලන් තත්වයට පත්ව ඇති බැවින් ව්‍යාපාරික කටයුතු සිදු කිරීමට නොහැකි වූ බවත් එම ආදායම් අහිමි වූ බැවින් මෙම කඩ කාමරය

වසා තැබූ කාල සීමාව සඳහා කුලී මුදල් සඳහා සහනයක් ලබා දෙන ලෙස බඳුකරු විසින් ඉල්ලීම් කර ඇත.

ඒ අනුව 2025 ජූලි මාසයට අදාල මාසික සභාවට මෙම ගැටළුව ඉදිරිපත් කර ඇති අතර 2025.07.22 දින පවත්වන ලද බිබිල ප්‍රාදේශිය සභාවේ මාසික සභා රැස්වීම් වාර්තාවේ අංක 05.01.12 තීරණය අනුව මගේ අංක BPS/03/09/01/A-16 හා 2025.11.24 දිනැති ලිපිය මඟින් පළාත් පාලන සහකාර කොමසාරිස් මඟින්,පළාත් පාලන කොමසාරිස් මඟින්,ඌව පළාත් ආණ්ඩුකාරතුමා වෙත බදු කුලියෙන් අත් හැරිමට තීරණය කරන ලද රු:5000.00 මුදලක මුදල ගරු ආණ්ඩුකාර අනුමැතියට ඉදිරිපත් කර ඇති බවත් මේ වන තුරු පිලිතුරක් නොලැබි ඇති බැවින් පිලිතුරක් දන්වා එවන ලෙස ඉල්ලීම් කරන ලදි.

එම ලිපියට පිලිතුරු ලෙස එම ලිපි ගොනුව සහකාර පලාත් පාලන කොමසාරිස් කාර්යාලයේ ලිපි ලේඛන වල සොයා ගත නොහැකි බව සහකාර පලාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් දුරකථන ඇමතුමක් ලබා දී පවසන ලද අතර ඒ පිලිබඳ ලිඛිතව දන්වන ලෙස මා විසින් පවසන ලදි .

ඒ අනුව පලාත් පාලන සහකාර කොසමාරිස්ගේ අංක 2/1/7/2/5 හා 2026.04.06 දිනැති ලිපිය මඟින් ගරු ආණ්ඩුකාර අනුමැතියට ඉදිරිපත් කිරිමට අවශ්‍ය ලිපි ලේඛන ඇතුලත් ගොනුව ඉදිරිපත් කරන ලෙස දන්වා ඇත.

එබැවින් 2025.07.22 දින පවත්වන ලද මාසික සභා රැස්විමේ අංක 05.01.12 තීරණය අනුව බිබිල පොදු වෙළඳපොල A 16 කඩ කාමරයේ බිත්ති පුපුරා අබලන් තත්වයට පත්ව ඇති බැවින් වසා තැබූ කාලසීමාව සඳහා ගෙවීමට ඇති රු.5000.00 ක මුදල කපා හැරිම පිළිබඳ සාකච්ඡා කර සුදුසු තීරණයක් ගැනිම සඳහා ඇමුණුම් සහිතව සකස් කරන ලද වාර්තාව මේ සමඟ ගරු සභාවට යෝජනා කරමි.

**බිබිල ප්‍රාදේශිය සභාවේ 2025.07.22 දින පවත්වන ලද මාසික සභා රැස්විමේ අංක 05.01.12 තීරණය අනුව සකස් කරන ලද බිබිල පොදු වෙළඳපොල A 16 කඩ කාමරයේ බිත්ති පුපුරා අබලන් තත්වයට පත්ව ඇති බැවින් වසා තැබූ කාලසීමාව සඳහා ගෙවීමට ඇති රු.5000.00 ක මුදල කපා හැරිම පිළිබඳ වාර්තාව**

| අනු අංකය | විස්තරය | පිලිතුර | ඇමුණුම |
|---|---|---|---|
| 01 | බඳුකරු ඉල්ලීම කර ඇති දිනය | ඉල්ලීම් ලිපි 2ක් ඉදිරිපත් කර ඇත.මුල් ලිපිය 2022.11.30 දිනලැබි ඇත.නමුත් එම ලිපිය කුමන කඩ කාමරයේද යන්න සටහන් කර නැත දුරකථන ඇමතුමක් ලබා දී කඩ කාමර අංකය තහවුරු කරගත් බව විෂය නිලධාරි විසින් ලිපියේ පසු පිට සටහන් යොදා ඇත.ඉන්පසු ඉදිරිපත් කර ඇති ලිපියේ බදුකරුගේ ඉල්ලීම් ලිපියේ දිනය සටහන් කර නැත.ලිපිය බිබිල ප්‍රාදේශිය සභාවට ලැබි ඇත්තේ(දින මුද්‍රාවේ සහන් පරිදි) 2022.12.21 | ඇමුණුම 04 A හා B |
| 02 | එම දිනය වන විට වසා තැබුවාද? | ආදායම් පරික්ෂක මහතාගේ සටහන් වාර්තාව අමුණා ඇත. | ඇමුණුම 05 |
| 03 | එදා සිට මේ දක්වා වසා තිබේද? | ආදායම් පරික්ෂක මහතාගේ සටහන් වාර්තාව අමුණා ඇත. | ඇමුණුම 06 A හා B |

| | | | |
|---|---|---|---|
| 04 | එම කඩ කාමරයේ සත්‍ය වශයෙන් ප්‍රශ්නයක් තිබේනම් එම ඉදි කිරිමට කාර්මික නිලධාරි විශාල වියදමක් ඉදිරිපත් කලේනම් එසේ ඉදි කිරිම් නොකළ බව | කාර්මික නිලධාරි ඇස්තමේන්තු හා වාර්තාව අමුණා ඇත. | ඇමුණුම 07<br>A හා B |
| 05 | මෙම මුදල් කපා හැරිම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීම් කල දිනය | 2023.04.10 හා 2023.08.04 | ඇමුණුම 08<br>A හා B |
| 06 | ගරු ආණ්ඩුකාරතුමා මේ සඳහා අනුමැතිය මේ තරම් කාලයක් නොදී ඇත්තේ ඇයි? | ගරු ආණ්ඩුකාර අනුමැතියට යවන ලද ලිපි ලේඛන සහකාර පලාත් පාලන කොමසාරිස් මහින්,පලාත් පාලන කොමසාරිස් මහින්,ඌව පලාත් පාලන අමාත්‍යාංශ ලේකම් මහින්,ගරු ආණ්ඩුකාරතුමා වෙත යවනු ලැබේ.අප විසින් යවන ලද ලිපි ලේඛන සහකාර පලාත් පාලන කොමසාරිස් කාර්යාලයේ නොමැති බව දුරකථනයෙන් දැනුම් දෙන ලදි. | ඇමුණුම 02 |
| 07 | නැවත සිහි කැදවිමක් කර ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීම් කිරිම | ගරු ආණ්ඩුකාර අනුමැතියට යවන ලද ලිපි ලේඛන සහකාර පලාත් පාලන කොමසාරිස් කාර්යාලයේ නොමැති බව දුරකථනයෙන් දැනුම් දෙන ලදි. | ඇමුණුම 02 |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

සුන්දර බේක් හවුස්, පොදු වෙළදපොල, බිබිල ලිපිනයෙහි එච්.එම්.කරුණාසුන්දර යන අය විසින් බදු ලබා ගෙන ඇති බිබිල ප්‍රාදේශිය සභාව සතු බිබිල පොදු වෙළදපොළ A 16 කඩ කාමරයේ බිත්ති පුපුරා අබලන් තත්වයට පත්ව ඇති බැවින් වසා තැබු කාලසීමාව සඳහා ගෙවීමට ඇති රු.5000.00 ක මුදල කපා හැරිමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**(ඉ).01.06. එළවළු වෙළඳපොල හිඟ මුදල් සම්බන්ධවයි.**

2026.01.22 දින පවත්වන ලද බිබිල ප්‍රාදේශිය සභාවේ මාසික සභා රැස්වීමේ අංක 05.01.06 අනුව ප්‍රදේශිය සභා පනතේ 58(1) හා 59(1) වගන්ති ප්‍රකාරව මෙම කඩ ඉවත් කිරිමට ප්‍රාදේශිය සභාවට බලයක් ඇති බැවින් මෙම එළවළු කඩ කාමර 18 ඉවත් කර රථ වාහන නැවතුම් පොළක් ඉදිකිරිමට හා 2026 ජනවාරි මස සිට එම කඩ කාමර වල බිල් කිරිම නතර කිරිමට සුදුසු බව තීරණය කර ඇත.

ඒ අනුව 2026 ජනවාරි මස සිට එළවළු කඩ කාමර 18 බිල් කිරිම නතර කර ඇත.

2026.02.17 දින පවත්වන ලද බිබිල ප්‍රාදේශිය සභාවේ මාසික සභා රැස්වීමේ අංක (ඉ).01.12 අනුව අංක 01,04,05,06,07,09,10,11,14,15,17 එළවළු කඩ කාමර සභා පනතේ අංක 19 (XII) වගන්තිය යටතේ වසර 03කට වඩා වැඩි කාල සීමාවක් බදුකරු හට බද්දට දෙන්නේ නම් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුය. මෙම ගිවිසුම්, ගිවිසුම් ගත වී වසර 03කට වැඩි කාලයක් ඉක්මවා ගොස් ඇති බැවින් මෙම බදු ගිවිසුම් මේ වන විට වලංගු නොවන බැවින් ගිවිසුම් අවලංගු කිරිමටත් ඒ පිළිබඳ අදාල පාර්ශවයන් වෙත දන්වා යැවිමට සුදුසු බවත් තීරණය කර ඇත.

ඒ අනුව අංක 01,04,05,06,07,09,10,11,14,15,17 එළවළු කඩ කාමර වල ගිවිසුම සභා පනතේ අංක 19 (XII) වගන්තිය ප්‍රකාරව ගිවිසුම අවලංගු කරන බවට ලිඛිතව බදුකරුවන් දැනුවත් කර ඇත.

මෙම කඩ කාමර 2026 ජනවාරි මස සිට බිල් කිරිම නතර කර ඇති නමුත් 2025.12.31 දිනට අංක 01,02,06,10,14, හා 18 යන එළවළු කඩ කාමර වලින් තව දුරටත් අය විය යුතු හිඟ ශේෂයක් ගිණුම්ගතවී ඇත. එම ශේෂයන් පිළිබඳ විස්තරය පහත පරිදි ඉදිරිපත් කරමි.

පහත සඳහන් හිඟ මුදල් ගෙවන ලෙස 2025.12.26 දින ලිඛිතව බදුකරුවන් දැනුවත් කර ඇත. නමුත් මේ වන තෙක් හිඟ මුදල් ගෙවා නැත.

එබැවින් මෙම හිඟ මුදල් අය කර ගැනිම පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

**එළවළු කඩ කාමර අය විමට ඇති හිඟ මුදල් පිළිබඳ විස්තරය**

| කඩ කාමර අංකය | බදුකරුගේ නම | ලිපිනය | හිඟ මුදල් පිළිබඳ විස්තරය ( කාල වකවානු සහිතව) | | | | | හිඟ ශේෂය | ගෙවීමට ඇති ප්‍රමාද ගාස්තුව | ගෙවීමට ඇති මුළු මුදල |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 2016 | 2017 | 2018 | 2024 | 2025 | | | |
| 1 | එම්.ටී.ජගත් ජයන්ත මයා | අංක 133,සිකුරාලන්ද,නාගල,බිබිල | | | | | 12000.00 | 12000.00 | 264.00 | 12264.00 |
| 2 | ඩී.එම්.ආනන්ද මයා | කණුගොල්ල වත්ත,ළිදකුඹුර,බිබිල | 4300.00 | 6000.00 | 4000.00 | | | 14300.00 | 44100.00 | 58400.00 |
| 6 | ඒ.එම්.රෝහිත කුසුම්සිරි මයා | උදාර ඉලුක්වත්ත,කොටගම,බිබිල | | | | | 6264.00 | 6264.00 | | 6264.00 |
| 10 | එම්.ටී.ප්‍රේමදාස මයා | ජගත් හෝටලය,බිබිල | | | | 2400.00 | 14400.00 | 16800.00 | 4884.00 | 21684.00 |

| | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 14 | ඒ.එම්.රෝහිත කුසුම්සිරි මයා | උදාර ඉලුක්වත්ත,කොටගම,බිබිල | | | | | 12000.00 | 12000.00 | 264.00 | 12264.00 |
| 18 | ටී.ඩබ්.එම්.ජීවන් තුසිත මයා | මොරත්තමුල්ල,නාගල,බිබිල | | | | | 9236.00 | 9236.00 | | 9236.00 |
| එකතුව | | | **4300.00** | **6000.00** | **4000.00** | **2400.00** | **53900.00** | **70600.00** | **49512.00** | **120112.00** |

වෙනත් කරුණු :- (01) ඩී.එම්.ආනන්ද මයා විසින් බදු ලබා ගෙන සිටි එළවළු කඩ කාමර අංක 02 සඳහා 2016,2017 හා 2018 වර්ෂ වල අය විමට ඇති හිඟ මුදල් සම්බන්ධයෙන් M5875 අංක දරණ මොණරාගල දිසා අධිකරණයේ පැවති නඩුව පිළිබඳ ආදායම් පරික්ෂක මහතාගේ වාර්තාව අමුණා ඇත.

(02.) අය වීමට තිබූ හිඟ මුදල වූ රු.15,500.00 න් රු.1200.00 මුදලක් අය වි ඇත.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බි.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා</u>

මෙම එළවළු කඩ කාමර පිළිබඳව ගොනුකර ඇති ලිපි ගොනු එකිනෙක පරික්ෂා බැලියයුතු බවත් එම කඩ කාමරවල ගිවිසුම් පිළිබඳව මනා අවබොධයක් ලබා ගෙන ඒවායේ ගිවිසුම්වල සීමාවන් අවසන් වී ඇත්දැයි මැනවින් අවබෝධ කරගෙන තීරණ ගැනීම වඩාත් සුදුසු බව පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාවට හිඟ මුදල් ගෙවීමට ඇති අංක 01, 02, 06, 10, 14, 18 එළවළු කඩ කාමරවල බදුකරුවන් මෙම මස ඇතුළත කැඳවීම් කර රැස්වීමක් පවත්වා ගෙවීමට ඇති හිඟ මුදල සමාන වාරික 05කින් ගෙවීම් කිරීමට හා රැස්වීම පවත්වා පළමු සතිය ඇතුළත පළමු වාරිකය අනිවාර්යයෙන් ගෙවීම් කිරීමට ආරම්භ කරන ලෙස දැනුවත් කිරීමටත් එසේ බදුකරුවන් ගෙවීම් නොකරන්නේ නම් නීතිමය පියවර ගන්නා බව දැනුවත් කිරීමටත්, මෙම බදුකරුවන් හිඟ කුලී මුදල් නොගෙවන්නේ නම් ඉදිරියේදී නීතිමය පියවර ගැනීමටත් තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

<u>**(ඉ).01.07. ප්‍රසම්පාදන කමිටුව සංශෝධනය කිරීම හා පත් කිරීම සම්බන්ධවයි.**</u>

2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදන කමිටුව සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වූ අතර එම කමිටුවෙහි සාමාජිකයෙකු වූ ගරු මන්ත්‍රී ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා 2026.04.21 දිනැති මහ සභාවේදී ප්‍රසම්පාදන කමිටු සාමාජිකත්වයෙන් ඉල්ලා අස්ව ඇති බැවින් ඒ සඳහා නව සමාජිකයෙකු පත් කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම්.වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

2026 වර්ෂයේ ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකත්වයෙන් ගරු මන්ත්‍රී ඒ.ඩී. නිශාන්ත අමරතුංග මැතිතුමා ඉවත් වූ බැවින් ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා පත් කිරීමට සුදුසු බව ගරු මන්ත්‍රී බී.එම්. වීරසේකර මැතිතුමා යෝජනා කරන ලදී.

එම යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

ඒ අනුව 2026 මැයි මස සිට ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයෙකු ලෙස පත් කිරීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**(ඉ).01.08. ගම්මැද්ද කලාලය වැඩසටහන සඳහා වැයවන මුදල් ප්‍රතිපූර්ණය කර ගන්නා තෙක් සභා අරමුදලින් දැරීමට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධවයි.**

අංක 12/05/01/01-08 දරණ 2026.04.27 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ ලිපියට අනුව ගම්මැද්ද කලාලය - 2026 වැඩසටහන් 10ක් අප ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මාසිකව ක්‍රියාත්මක කිරීම සඳහා රු.15000.00ක මුදල බැගින් වැඩසටහන් 10 සඳහා රු.150000.00 ක් වියදම් දැරීමට සිදුවන බවත් ,එම මුදල ප්‍රතිපූර්ණය කරන බවත් පළාත් පාලන කොමසාරිස් වැඩිදුරටත් දන්වා ඇත. ඒ අනුව අදාළ මුදල් ප්‍රතිපූර්ණය කරන තෙක් සභා අරමුදලින් එම වැඩසටහන් 10ට වියදම් දැරීම සඳහා අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එස්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා</u>

ඌව පළාත් ලේකම්තුමියගේ සංකල්පයකට අනුව ඌව පළාත තුළ ගම්මැද්ද කලාලය වැඩසටහන වසම් මට්ටමින් පැවැත්වීමට කටයුතු යොදා ඇති බවත් ඒ සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල හා ප්‍රාදේශීය සභාවන් වල නිළධාරි මණ්ඩලයන් පත්කර ඇති බවත් පැවසීය. මහ ජනතාව අවබෝධ කරගෙන සිටින්නේ ගමේ ජනතාවගේ ගැටලු විසඳීමට සිටින්නේ ග්‍රාම නිළධාරි, සමෘද්ධි සංවර්ධන නිළධාරි , කෘෂිකර්ම පර්යේෂණ නිළධාරි , පවුල් සෞඛ්‍ය සේවා නිළධාරිණී, වසම භාර සංවර්ධන නිළධාරි යන නිළධාරි පමණක් බවයි. නමුත් ආයතනවල මෙම නිළධාරීන්ට අමතරව ජනතාවගේ

ගැටලු නිරාකරණය කිරීමට තවත් නිළධාරීන් සිටින බවත් ඒ අයගෙන් ලැබෙන සේවාවන් , සේවාව ලබා ගන්නා ආකාරය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමට ගම්මැද්ද කළාලය වැඩසටහන පවත්වන බව පැවසීය. මව්කුසට දරුවෙකු පැමිණීමේ සිට මරණය දක්වාම සිදුවන පෙරපාසල, ළමාවිය තරුණවිය, මහළුවිය, යන සමයන් වලදී සිදුකරනු ලබන කාර්යයන් පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාදීමටත් මෙම වැඩසටහන පවත්වනු ලබයි. පෙබරවාරි, මාර්තු, අප්‍රේල් මාස තුළ නාගල විද්‍යාලය, දොඩම්ගොල්ල විද්‍යාලය, බුළුපිටිය විද්‍යාලය යන ස්ථානවල ගම්මැද්ද කළාලය වැඩසටහන පැවැත්වූ බවත් පෙබරවාරි මාසය තුළ වාර්තා යැවීමට ප්‍රමාදවීම හේතුවෙන් බිබිල ප්‍රාදේශීය සභාවට ළකුණු නොලැබුණද මාර්තු මාසයේදී ළකුණු 61ක් ලබාගෙන ඇති බවත් අප්‍රේල් මාසයේ ළකුණු 77ක්ද ලබාගෙන ඇති බවත් බිබිල ප්‍රාදේශීය සභාව ප්‍රධාන දායකත්වයෙන් සම්බන්ධීකරණයෙන් සිදුකරනු ලබන මෙම වැඩසටහන පිළිබඳව සතුටුදායක බවත් පැවසූ අතර ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන දායකත්වයෙන් මෙම වැඩසටහන පවත්වන බැවින් මේ සඳහා එක් වැඩසටහනකට රු.15,000.00 ක මුදලක් වැය කිරීම ප්‍රාදේශීය සභාවට පැවරී ඇති බවත් නමුත් මෙම මුදල සභා අරමුදලින් වැය කළද නැවත් ප්‍රතිපූරණය කරන බවද පැවසීය.

වැඩසටහන් 10ට රු.150,000.00 ක මුදලක් වැයවන බවත් පෙබරවාරි, මාර්තු , අප්‍රේල් යන මාස සඳහා මේ වනවිට රු.45,000.00ක මුදලක් සභා අරමුදලින් වැයවී ඇති බවත් මැයි මාසය සඳහාද රු.15,000.00 ක මුදලක් සභා අරමුදලින් වැය කිරීමට අවශ්‍ය බවත් පැවසීය. මෙම මුදල වැඩසටහන සඳහා ප්‍රමාණවත් නොවන බවත් විශ්‍රාමික විදුහල්පති සිරිවර්ධන මහතා හා තමන් මේ සඳහා මුදල් යොදවන බවත් පැවසීය. මැයි මාසයට අදාළව සිදු කරනු ලබන ගම්මැද්ද කළාලය වැඩසටහන කොටගම විහාරස්ථානයේ දී සිදු කිරීමට නියමිත බවත් එය පැවැත්වීමට පෙර ගම්වාසීන් එක්රැස් කර රැස්වීම් දෙකක් පැවැත්වූ බවත් පැවසූ අතර මෙම වැඩසටහන පැවැත්වීමට පෙර කොටගම කොට්ඨාසයේ මාර්ග, සභාවේ JCB යන්ත්‍රය යොදාගෙන සභාවේ කම්කරු මහතුන් යොදවා මාර්ග පිළිසකර කරදීමට කටයුතු කරන ලෙස ගරු මූලාසනයෙන් හා සභා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටින ලදී. 2026 මැයි 22 වන දින පවත්වනු ලබන මෙම වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා සභාව ගරු මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනා සහභාගි වී සහයෝගය ලබා දෙන ලෙසද ඉල්ලීමක් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්. ධම්මික බණ්ඩාර මැතිතුමා</u>

දිට්වා සුළි කුණාටුව නිසා කොටගම මාර්ගයක් , යාමට නොහැකි ලෙසම අබලන්වීම නිසා අහිංසක ජනතාවගේ වී ටිකවත් රැගෙන යාමට නොහැකි තත්වයට පත්වී ඇත. එබැවින් එම මාර්ගය ගම්මැද්ද කළාලය වැඩසටහන පැවැත්වීමට පෙර ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඉල්ලා සිටි අතර කොටගම මංසන්ධිය අසළ වීථි ලාම්පු 04ක් අක්‍රිය වී ඇති බැවින් ගම්මැද්ද කළාලය වැඩසටහන පැවැත්වීමට පෙර එම බල්බ් යෙදීමට කටයුතු කර දෙන ලෙස ගරු මූලාසනයෙන් ඉල්ලා සිටින ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඉ).01.09. 2026 වසරේ සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම.</u>**

බිබිල ප්‍රාදේශීය සභාව මගින් 2026 වර්ෂයේදී සිදු කිරීමට අපේක්ෂිත පහත සංවර්ධන යෝජනා සඳහා අනුමැතිය ලබාදීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | මූලා ප්‍රභවය | කර්මාන්ත වර්ගය | කර්මාන්තයේ නම | ප්‍රතිපාදන මුදල රු. මි. | ඇස්තමේන්තු මුදල රු.මි. |
|---|---|---|---|---|---|
| 1 | | | යල්කුඹුර ගම්මැද්ද පිවිසුම් මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 2 | 2 |
| 2 | | | දොඩම්ගොල්ල කකුරුගොල්ල අරාව මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 2 | 2 |
| 3 | | | රතුපස්කැටිය,රතුවඹ,ඊරියගොල්ල මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 2 | 2 |
| 4 | | | කරගහවෙල බටහිර මධ්‍යස්ථානයේ සිට පේරගස්පිටිය ප්‍රජාශාලාව දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 2 | 2 |
| 5 | | මාර්ග | අඹගොල්ල පේමරත්න මහතාගේ නිවසේ සිට මඩුලන්ද දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 2 | 2 |
| 6 | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන(PSDG) | | ගැටහවෙල ප්‍රධාන මාර්ගයේ සිට ගලඹය මුල්ල දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 2 | 2 |
| 7 | | | මහියංගන මාර්ගයේ ඇහලුම් කම්හල ඉදිරිපිට නළ ළිඳ අසල මාර්ගය (දකුණු පස) කොන්ක්‍රීට් කිරීම. | 2 | 2 |
| 8 | | | මොරත්තමුල්ල අඹගහකිවුල මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1 | 1 |
| 9 | | | සිකුරාලන්ද පොදු ළිඳ වැඩිදියුණු කිරීම | | |
| 10 | | පොදු ළිං 04 ක් පිළිසකර කිරීම | කරගහවෙල පොදු ළිඳ වැඩිදියුණු කිරීම | 1.5 | 1.5 |
| 11 | | | දමුණුලන්ද හේනගහවත්ත පොදු ළිඳ වැඩි දියුණු කිරීම | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 12 | | | කරාඩුගල පොදු ළිඳ වැඩි දියුණු කිරීම | | |
| 13 | | | මො/කරගහවෙල කනිටු විදුහල් භූමියේ පිහිටි නළ ළිඳ | | |
| 14 | | | වැගම දකුණ කුඩුම්රහ III මාර්ගයේ අරංගල කන්ද දෙසට නිවාස පිහිටි ස්ථානයේ නළ ළිඳ | | |
| 15 | | | කුඩුම්රහ I නළ ළිඳ | | |
| 16 | | | පල්ලේ අරාව නළ ළිඳ | | |
| 17 | | | බදුල්ලගම්මන දියකොළයාය නළ ළිඳ | | |
| 18 | | | කොකුන්නෑව ජන උදාකළ ගම්මානයේ නළ ළිඳ | | |
| 19 | | අක්‍රීය නල ළිං 15 ක් පිළිසකර කිරීම | දම්පතිගම ජුපිටර් රේඩියෝ නිවස අසල නළ ළිඳ | 2 | - |
| 20 | | | කනවේගල්ල පාසල් පාර 300m ගියවිට හමුවන නළ ළිඳ | | |
| 21 | | | ළිඳකුඹුර කිවුලපිටලන්ද අතුල මහතාගේ නිවස අසලින් යන පාරේ ඇති නළ ළිඳ | | |
| 22 | | | කරාඩුගල පහළ ගම නළ ළිඳ | | |
| 23 | | | බිබිලවත්ත 200 නළ ළිඳ | | |
| 24 | | | කටුපොත පාර කවුඩැල්ල සංජීව මහතාගේ නිවස අසල නළ ළිඳ | | |
| 25 | | | ගලහ පාර කවුඩැල්ල විලියම් මහතාගේ නිවස අසල නළ ළිඳ | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 26 | | | කටුපොත ඩොනර් මහතාගේ නිවස අසල නළ ළිඳ | | |
| 27 | | කසළ ප්‍රතිචක්‍රීකරණය | කොම්පෝස්ට් අංගනයේ ප්‍රතිචක්‍රීකරණ එකතු කිරීමේ මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම | 5 | - |
| 28 | නම්‍යශීලි අරමුදල් | බෝක්කු/මාර්ග/ජල ව්‍යාපෘති | මොරත්තමුල්ල අඹගහකිවුල මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම | 1 | 1 |
| 29 | | | දොඩම්ගොල්ල කකුරුගොල්ල අරාව මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම | 1 | 1 |
| 30 | | | කරාඩුගල මාර්ගයේ බෝක්කුව ඉදිකිරීම | 2 | 2 |
| 31 | | | රතුපස්කැටිය,ගල්ගේලන්ද මාර්ගයේ අරංගල කන්ද දෙසට මාර්ගය සංවර්ධනය කිරිම | 1 | 1 |
| 32 | | | කොකුන්නෑව ජල ව්‍යාපෘතිය | 4 | 4 |
| 33 | රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යංශ නව ආදායම් උත්පාදන ව්‍යාපෘතිය | ගොඩනැගිලි | වානිජ ගොඩනැගිල්ල(සතොස)උඩු මහළ සංවර්ධනය කිරීම | 10 | 27.51 (ඉතිරි මුදල සහා අරමුදලින් හෝ දේශීය ණය සංවර්ධන අරමුදලින් ණය මුදලක් ලබාගෙන දැරීමට නියමිතයි) |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>**ගරු මන්ත්‍රී පී.ජයන්ති මැතිතුමිය**</u>

මෙම යෝජනාවෙහි ඇතුළත් පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ අංක 3හි ඇතුළත් රතුපස්කැටිය රතුවඹ ඊරියගොල්ල මාර්ගය යන්නෙහි **රතුවඹ නොව එය කුරුවාඹ ලෙස** සංශෝධනය වියයුතු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය</u>**

මෙම යෝජනාවෙහි ඇතුළත් පළාත් නිශ්චිත ප්‍රදාන යටතේ අංක 4හි ඇතුළත් **කරගහවෙල බටහිර මධ්‍යස්ථානයේ සිට පේරගස්පිටිය ප්‍රජා ශාලාව දක්වා මාර්ගය** කොන්ක්‍රීට් කිරීම යන්න **කරගහවෙල බටහිර නිකේතනය අසලින් වන මාර්ගයේ මද දුරක් ගොස් එතැන් සිට කොටස් දෙකකට පේරගස්පිටිය**

**ප්‍රජාශාලාව දක්වා මාර්ගය** කොන්ක්‍රීට් කිරීම ලෙස සංශෝධනය වියයුතු බවත්,

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අංක 7හි ඇතුළත් **මහියංගන මාර්ගයේ ඇගලුම්හල ඉදිරිපිට නළ ළිඳ අසළ මාර්ගය** (දකුණුපස ) කොන්ක්‍රීට් කිරීම ලෙස දක්වා ඇති මාර්ගය වෙනස් කර **වෑගම දකුණ කොට්ඨාසයට අයත් කුඩුම්රහවත්ත 3 මාර්ගය** ලෙස වෙනස් කිරීමට ඉදිරිපත් කර ඇති බැවින් එම මාර්ගයද සංශෝධනය වියයුතු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා</u>

පොදු ළිං 4ක් පිළිසකර කිරීම යටතේ අංක 11හි සඳහන් **දමුණුලන්ද හේනගහවත්ත පොදු ළිඳ** වැඩිදියුණු කිරීම යන්න **දමුණුලන්ද ගොන්නගහවත්ත පොදු ළිඳ** ලෙස සංශෝධනය වියයුතු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා</u>

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ අංක 6හි සඳහන් **ගැටහවෙල ප්‍රධාන මාර්ගයේ සිට ගලඹයමුල්ල දක්වා මාර්ගය** කොන්ක්‍රීට් කිරීම යන්න **දියකොළයාය ප්‍රධාන මාර්ගයේ සිට ගලඹයමුල්ල දක්වා මාර්ගය** කොන්ක්‍රීට් කිරීම ලෙස සංශෝධනය වියයුතු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා</u>

නම්‍යශීලී අරමුදල් යටතේ බොක්කු / මාර්ග ජල ව්‍යාපෘති යටතේ දොඩම්ගොල්ල කකුරුගොල්ලඅරාව මාර්ගයේ බෝක්කු ඉදිකිරීම සඳහා රු මිලියන 1කින් ඉදිකිරීමට නොහැකි බැවින් එහි ප්‍රතිපාදන මුදල රු.මිලියන 2ක් ලෙස සංශෝධනය වියයුතු බව පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා ස්ථිර කරන ලදී.

ප.ව. 12.25 ට ඒ.ඩී.නිශාන්ත අමරතුංග මැතිතුමා සභා ගර්භයෙන් පිටව යන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

ගරු මන්ත්‍රී ඒ. එම්. ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ඉදිරිපත් කළ සංශෝධනය හැර අනෙකුත් සංශෝධනවලට යටත්ව බිබිල ප්‍රාදේශීය සභාවෙහි 2026 වර්ෂයේද සිදු කිරීමට අපේක්ෂිත සංවර්ධන යෝජනා සඳහා අනුමැතිය ලබාදීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.10. බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල, නාගල, කොටගම පුස්තකාලවල පැරණි පුවත්පත් අලෙවි කිරීම සම්බන්ධවයි.**

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල, නාගල ,කොටගම යන පුස්තකාල සඳහා දෛනික හා සතිපතා මිලදී ගන්නා ලද පසුගිය වර්ෂවල පැරණි පුවත්පත් පුස්තකාල වලින් ඉවත් කිරීමට අවශ්‍යව ඇත. එබැවින් ඒවා අලෙවි කිරීමට අනුමැතිය ලබා දීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.11. ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් බිබිල ප්‍රාදේශීය සභාව මඟින් කුලියට දෙනු ලබන වාහන සඳහා පහත සඳහන් වාහන වල කුලී මුදල් සංශෝධනය කිරීම සම්බන්ධවයි.**

2026 ගැසට් පත්‍රයට අනුව සභාව සතු වාහන කුලියට දීමේ ගාස්තු පහත පරිදි වේ.

**01.ගලි බවුසරය කුලියට දීම.**

| | |
|---|---|
| බල ප්‍රදේශය තුළ | |
| පළමු වාරයට (පළමු ගලි බවුසරය) | 5000.00 |
| අමතර වාරයකට | 4500.00 |
| බල ප්‍රදේශයෙන් පිටත | |
| පළමු වාරයට (පළමු ගලි බවුසරය) | 6000.00 |
| අමතර වාරයකට | 5000.00 |
| කම්කරු ගාස්තු (එක් වරකට) | 500.00 |
| ධාවනය කරනු ලබන සෑම කි.මී 01 ක් සඳහා | 100.00 |
| (අපද්‍රව්‍ය ලබාගන්නා ස්ථානයේ සිට බැහැර කරන ස්ථානය දක්වා යාමට හා ඒමට) | |

02. රථ වාහන හා යන්ත්‍රසූත්‍ර

<u>මෝටර් ග්‍රේඩරය</u> - (ඉන්ධන සහිතව) 8000.00
(අවම පැය 01කට ගෙවිය යුතුයි)
වෙළඳපොල ඉන්ධන මිල අනුව පැය 1 සඳහා ප්‍රාදේශිය සභාව විසින් යන්ත්‍රය සඳහා ලබා දී ඇති ඉන්ධන තුලනය අනුව සේවාලාභියා විසින් ඉන්ධන සඳහා ගාස්තු ගෙවිය යුතු අතර වෙළඳපොල ඉන්ධන මිල වෙනස්වීමකදී අයකරගන්නා ඉන්ධන ගාස්තුවද සංශෝධනය වේ.

<u>බැකෝ ලෝඩරය</u> - (ඉන්ධන රහිතව) 5000.00
(අවම පැය 01කට මුලින් ගෙවිය යුතුය )

වෙළඳපොල ඉන්ධන මිල අනුව පැය 1 සඳහා ප්‍රාදේශිය සභාව විසින් යන්ත්‍රය සඳහා ලබා දී

ඇති ඉන්ධන තුලනය අනුව සේවාලාභියා විසින් ඉන්ධන සඳහා ගාස්තු ගෙවිය යුතු අතර වෙළඳපොල ඉන්ධන මිලවෙනස්වීමකදී අයකරගන්නා ඉන්ධන ගාස්තුවද සංශෝධනය වේ

**ටිපර් රථය** (කියුබ් 2.5) 2500.00

කි.මී.2.5 ක් තුළ එක් ටිපර් ලෝඩ් 1 ක් ප්‍රවාහනය
කර නැවත එම ස්ථානයට පැමිණීම සඳහා

වැඩිවන සෑම කි.මී 1 ක් සඳහාම රු.200.00 ක් අය කරනු ලබන අතර ප්‍රවාහනය කරනු ලබන සෑම ටිපර් ලෝඩ් 1 ක් සඳහාම මෙය වලංගු වේ.

**ගල් රෝල (මාර්ග තලනය)** යන්ත්‍ර පැය 1 ක් සඳහා ඉන්ධන රහිතව 5500.00

(වෙළඳපොල ඉන්ධන මිල අනුව පැය 1 සඳහා ප්‍රාදේශීය සභාව විසින් යන්ත්‍රය සඳහා ලබා දී ඇති ඉන්ධන තුලනය අනුව සේවාලාභියා විසින් ඉන්ධන සඳහා ගාස්තු ගෙවිය යුතුය)

(යන්ත්‍රය රැගෙන ගිය පසු කාර්මික දෝෂයක් හා යන්ත්‍රක්‍රියාකරු නොමැති විට හැර වැඩ නොමැතිව දින 3 කට වඩා රඳවා තබා ගන්නේ නම් එම සෑම දිනකටම රු 1000.00 බැගින් අය කරනු ලබන අතර නැවත වැඩ ආරම්භකරන තෙක් මෙම ගාස්තු අය කිරීම වලංගු වේ.)

**ජල බවුසරය**

| කාරණය | ජල බවුසරයට දිනකට රු. ශත | පළමු කි.මි.05 ඇතුළත ට්‍රැක්ටරයට යාමට හා ඒමට රු. ශත | පළමු කි.මි. 05 හැර වැඩිවන සෑම කි.මි 01 ක් සඳහා යාමට සහ ඒමට රු. ශත |
|---|---|---|---|
| මළ ගෙදරකට | නොමිලේ | නොමිලේ | නොමිලේ |
| අඩු ආදායම්ලාභීන් සඳහා (ප්‍රාදේශීය ලේකම්,ග්‍රාමනිලධාරි නිර්දේශය මත) | නොමිලේ | රු. 2,000.00 | නොමිලේ |
| නිවාස වල වෙනත් උත්සව සඳහා හා බීමට ජලය ගැනිම | රු. 2000.00 | රු. 2,000.00 | රු. 200.00 |
| නිවාස වල වෙනත් උත්සව සඳහා හා බීමට ජලය සැපයීමේදි ටැංකි වල ජලය පුරවා නැවත රැගෙනඒම. | රු.1500.00 | රු. 2000.00 | රු. 200.00 |
| ඉදිකිරීම් හා සම්බන්ධ කටයුතු සඳහා ජල බවුසරය ප්‍රවාහනය කර භාරදීම | රු. 4000.00 | රු. 2000.00 | රු. 200.00 |
| කොන්ත්‍රාත් කටයුතු සඳහා ජල බවුසරය සමග ට්‍රැක්ටරය යොදා ගන්නා අවස්ථා | රු. 4000.00 | දිනකට රු. 9,000.00 උපරිම කි.මි. 60 ක් තුළ | රු. 200.00 |

| | | | |
|---|---|---|---|
| ලීටර් 13000 ජල බවුසරය සම්පූර්ණයෙන් පුරවා ලබා ගැනීම සඳහා | රු.10000.00 | රු.2500.00 | රු.250.00 |
| ජලය රහිත හිස් බවුසරය කුලියට ලබා ගැනීම | රු.5000.00 | රු.2500.00 | රු.250.00 |

ප්‍රාදේශීය සභාවේ ජල බවුසරය සඳහා පුරවන ස්ථානයට රැගෙන එන පෞද්ගලික ජල ටැංකි හා ජල බවුසර් සඳහා ජලය පුරවා දීමේදී අය කළ යුතු ගාස්තු

ලීටර් 1000 රු. 500.00
ලීටර් 2000 රු. 1000.00
ජල බවුසරය රු. 2000.00

ට්‍රැක්ටරයට සවි කරන ලද තණකොළ කපන යන්ත්‍රය සඳහා රු. 12000.00
බල ප්‍රදේශය තුළ දිනකට (පැය 8)
ට්‍රැක්ටරයට සවි කරන ලද තණකොළ කපන යන්ත්‍රය සඳහා
දින 1/2 (පැය 4) (බල ප්‍රදේශය තුළ) රු. 6000.00
(අවම වශයෙන් පැය 4 කට ගෙවිය යුතුයි.)

2026 වර්ෂයේ අවස්ථා කිහිපයකදීම ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් ඉහත මිල ගණන් වැඩිකර සංශෝධනය කිරීමට සුදුසු බැවින් එම මුදල සාකච්ඡා කර තීරණය කරන ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා**

ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් බිබිල ප්‍රාදේශීය සභාව මගින් කුලියට දෙනු ලබන වාහන සඳහා අයකරනු ලබන කුලී මුදල් සංශෝදනය කිරීම සඳහා කාර්මික නිළධාරිට භාරදී එම නිළධාරි විසින් ඉදිරිපත් කරනු ලබන සංශේධනයන්ට යටත්ව ඒ අනුව අයකිරීමට සුදුසු බව පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාව මගින් කුලියට දෙනු ලබන වාහන සඳහා අයකරනු ලබන කුලී මුදල් ඉන්ධන මිල ඉහළ යාම නිසා සංශෝදනය කිරීමට බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්මික නිළධාරි වෙත භාර දී එම නිළධාරි විසින් ඉදිරිපත් කරනු සංශෝදිත කුලී මුදල් වාර්තාව ඉදිරි මහ සභාවට ඉදිරිපත් කර අනුමත කර ගැනීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.12. 2026 වර්ෂයේ ප්‍රවාහන සැලැස්ම සඳහා වෙන් වූ ප්‍රතිපාදනවලින් බස් මගී ආවරණ ඉදිකිරීම සම්බන්ධවයි.**

ඌව පළාත් ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂ කර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2026.04.29 දිනැති ලිපිය මඟින් බිබිල බදුල්ල මාර්ගයේ යල්කුඹුර කොටගම හන්දිය අසල (ලුණුගල දෙසට) බස් මගී ආවරණයක් ඉදිකිරීම සඳහා රු.මි.0.52 ක මුදලක් වෙන්කර එවා ඇත.

නමුත් දැනට යල්කුඹුර සේනාපතිය හන්දියට බස් මගී ආවරණයක් නොමැති බැවින් යල්කුඹුර සේනාපතිය හන්දියේ බස් මගී ආවරණයක් ඉදි කරදෙන ලෙස යල්කුඹුර ගම්වාසීන් ඉල්ලීම් කර ඇත. එබැවින් ඉහත ප්‍රතිපාදන මුදලින් යල්කුඹුර කොටගම හන්දිය අසල බස් මගී ආවරණය ඉදි නොකර යල්කුඹුර සේනාපතිය හන්දියේ මගී ආවරණයක් ඉදිකිරීමට අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඒ.එම්.ධම්මික බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.13. බිබිල නගරයේ අංක 01 එළගවමස් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන එම්.එච්.එම්.නසීර් මහතා විසින් හිඟ මුදල සඳහා ගලපා ඇති ප්‍රමාද ගාස්තු ඉවත් කර මුදල පමණක් ගෙවීමට අවස්ථාව ලබා දෙන ලෙස කර ඇති ඉල්ලීම සම්බන්ධවයි.**

ඉහත ඉල්ලීම සම්බන්ධයෙන් 2026.04.21 දින පවත්වන ලද බිබිල ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේදී සාකච්ඡා කර ඇත. ඒ අනුව මහ සභාව විසින් බිබිල එළගවමස් වෙළඳසැලට අදාල ගිවිසුමෙහි ඇතුළත් හිඟ මුදල් සඳහා අය කරනු ලබන ප්‍රමාද ගාස්තු ප්‍රතිශතය අතුරු ව්‍යවස්ථාවට අනුකූලව සකස් කර තිබේදැයි පරික්ෂා කර බලා ඒ පිළිබඳව සමාලෝචන වාර්තාවක් සමග නැවත මහ සභාවට ඉදිරිපත් කිරීමට කල් තබා ඇත. එබැවින් ඒ සම්බන්ධයෙන් සකස් කරන ලද වාර්තාව පහත පරිදි වේ.

මෙම ප්‍රාදේශීය සභාවට අයත් ටෙන්ඩර් මගින් බදු දෙනු ලබන දේපල (බිබිල එළගවමස් කඩය) සඳහා ගිවිසුම් ප්‍රකාරව පහත පරිදි අය කරනු ලබයි.**''වසරට නියමිත බදු මුදලින් මාසයට ගැනෙන මුදල බදුකරු විසින් අදාල මාසයේ අවසාන දිනයේ හෝ එදිනට ප්‍රථම ගෙවිය යුතුය. ඉන් පසු ප්‍රමාදවන සෑම දිනකටම මාසික බදු මුදලින් සියයට එකක් (1%) ප්‍රමාද ගාස්තු වශයෙන් ගෙවිය යුතුය.''(අදාල ගිවිසුමෙහි පිටපතක් මේ සමග අමුණා ඇත)**

මෙම ( 1%) දඩ මුදල අයකිරීම මෙම ප්‍රදේශීය සභා ගිවිසුම් තුළ දිගු කලක් තිස්සේ පැවත එන්නකි. උදාහරණ වශයෙන් 2022 වර්ෂයේ බදු ගිවිසුමක පිටපතක්ද මේ සමග අමුණා ඇත.සෑම වර්ෂයකම බදුකරු සමග ගිවිසුම් ගතවීමට ප්‍රථම බදු ගිවිසුම් සඳහා අනුමැතිය ලබා ගැනීමට මහ සභාවට ඉදිරිපත් කර ඇත. එහෙත් ගිවිසුමෙහි ප්‍රමාද ගාස්තු අයකිරීම සම්බන්ධ කොන්දේසිය මෙතෙක් සංශෝධනය කර නොමැත. එසේම මෙම කොන්දේසිය පැවතීම තුළින් අදාල මාසය තුළම බදු කුලී මුදල අය කර

ගැනීමට හැකියාව ඇත. ප්‍රමාද වීම නිසා දඩ මුදල් දිනෙන් දින එකතු වන බිය හේතුවෙන් අදාල මාසය තුළම කුලී මුදල් පියවීමටද බදු කරුවන් පෙළඹෙයි.

**ප්‍රාදේශීය සභාවට අයත් ටෙන්ඩර් මගින් බදු දෙනු ලබන දේපලවල (මස් කඩවල) දඩ මුදල් අයකිරීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ හෝ අංක 1816/43 -2013.06.28 දිනැති අතුරු ව්‍යවස්ථා සම්බන්ධ ගැසට් පත්‍රයේ මස් /මාළු විකිණීම සම්බන්ධයෙන් ඇති අතුරු ව්‍යවස්ථාවේ බදු කුලී අයකිරීම හෝ ප්‍රමාද ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් කිසිදු සඳහනක් නැත.**

නමුත් 2013.06.28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ 15 වෙනි කොටසේ **පොදු හෝ පෞද්ගලික වෙළඳපොළවල්** සම්බන්ධ සම්මත අතුරු ව්‍යවස්ථාවේ පහත පරිදි දක්වා ඇත.

**"42. (i) පොදු වෙළඳපොළෙහි කිසියම් කඩ කාමරයක් සඳහා බදුකරුවන් විසින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු එක් එක් මාසයේ බදු කුලිය ගෙවී යුතු දිනය එකී කඩකාමරය බදු දීමට අදාළ ගිවිසුමෙහි නිශ්චිතව සඳහන් කර තිබිය යුතුවාක් හැර එකී දින හෝ එදිනට පෙර එකී බදු මුදල ප්‍රාදේශීය සභාවට ගෙවීම බදුකරුගේ කාර්යය වන්නේය.**

**( ii) කවර හෝ බදුකරුවකු විසින් 42(1) ඡේදයේ නියම කර ඇති ආකාරයෙන් අත්සන් කළ ගිවිසුමට අනුව එකග වූ දිනයේ හෝ ඊට ප්‍රථම අදාල මාසික කුලිය ප්‍රාදේශීය සභාවට ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක නියමිත දින සිට ගෙවීමට ඇති සෑම මාසයක් හෝ ඉන් කොටසක් වෙනුවෙන් අදාල මාසික කුලියෙන් 10% ක ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට බදුකරු යටත් විය යුතුවාක් හැර මෙකී නියමයන් අදාල ගිවිසුමේ ඇතුළත් කර තිබිය යුතුය,"**

මේ අනුව මෙම වගන්තිය දීර්ඝ කාලීනව බදු දෙනු ලබන පොදු වෙළඳපොළ කඩ කාමර සඳහා සම්මත කරන ලද්දකි. මෙය වාර්ෂිකව බදු දෙනු ලබන දේපල වලට අදාල කර ගැනීමේ හැකියාව සම්බන්ධයෙන් ගැටළුකාරී තත්වයක් මතුව ඇත. මෙම 42 වගන්තිය ප්‍රකාරව ප්‍රමාද ගාස්තුව අය කරන විට සභාවට අවාසි සහගත බවක් පෙනී යයි. ඒ කෙසේද යත් බදුකරුට බදු ගෙවීමට ඇති මාසයේ අවසන් දින පසුවී එක් දිනක් ප්‍රමාද වී කුලීමුදල ගෙවුවද ,නැතහොත් මාසයක්ම ප්‍රමාද වී ගෙවුවද ප්‍රමාද ගාස්තුව අදාල මාසික කුලියෙන් 10% කි.මේ හේතුවෙන් බදුකරුවන් කුලී මුදල් කලට වේලාවට ගෙවීමට මැලිවෙති. මාසයක් ප්‍රමාද වුවද ප්‍රමාද ගාස්තුව ඉහල නොයන බැවිනි.

එසේම බදුකරුවන් සමග 2026 වර්ෂය සඳහා මහ සභාව විසින් අනුමත කරන ලද බදු ගිවිසුමකට මේ වන විට එළඹී ඇත. එබැවින් ප්‍රමාද ගාස්තුව මෙම වර්ෂය තුළ වෙනස් කළ හොත් නැවත බදුකරුවන් සමග ගිවිසුමකට එළඹිය යුතුය.එය ගැටළු සහගතය. 2027 වර්ෂය සඳහා බදුකරුවන් සමග ගිවිසුම්

ගතවීමට ප්‍රථම මහ සභාවේ අනුමැතිය සඳහා දැනට පවතින බදු ගිවිසුම් යොමු කරන බැවින් ප්‍රමාද ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීමට හැකියාව පවතී.එසේම නසීර් මහතා මසකට රු.269,166.67 ක කුලීමුදලක් ගෙවිය යුතු අතර ප්‍රමාද වන එක් දිනක් සඳහා රු.2,691.66 ක ප්‍රමාද ගාස්තුවක් ගෙවීමට සිදුවේ. ඒ අනුව නසීර් මහතාගෙන් මැයි මාසය වන විට අයවීමට ඇති මුදල් පිළිබඳ

වාර්තාවක් ඇමුණුම 01 හි ඇත.ඒ අනුව මේ මහතාගෙන් අයවීමට ඇති හිග මුදල් සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ගැනීම සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

**බිබිල එළගවමස් වෙළඳසැළෙන් 2026 වර්ෂයේ අයවීම් හා හිග මුදල් සම්බන්ධ වාර්තාව**

| වර්ෂය හා මාසය | මාසික කුලී මුදල රු. | ගෙවීම් කර ඇති දිනය | ගෙවා ඇති මුදල රු. | කුලියෙහි හිග මුදල රු. | ප්‍රමාද වී ඇති දින ගණන රු. | ප්‍රමාද ගාස්තුව රු. | ගෙවිය යුතු මුළු මුදල රු. |
|---|---|---|---|---|---|---|---|
| 2026 ජනවාරි | 269,166.67 | 2026.02.06 | 269,166.67 | | 5 | 13,458.03 | |
| 2026 පෙබරවාරි | 269,166.67 | 2026.03.23 | 200,000.00 | 69,166.67 | 22 | 59,216.52 | |
| 2026 මාර්තු | 269166.67+69166.67 | 2026.04.29 | 138,333.34 | 200,000.00 | 28 | 94,732.96 | |
| 2026 අප්‍රේල් | 269166.67+200000 | - | - | 469,166.67 | 30 | 140,749.80 | |
| 2026 මැයි | 269,166.67 | - | - | 269,166.67 | | | |
| එකතුව | | | **607,500.01** | **738,333.34** | | **308,157.31** | **1,046,490.65** |

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

**<u>ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා</u>**

බිබිල නගරයේ අංක 01 එළගව මස් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන එම්.එච්.එම්. නසීර් මහතා විසින් ගෙවීමට ඇති හිඟ මුදල් සඳහා ගලපා ඇති ප්‍රමාද ගාස්තුව කපාහැරීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට සුදුසු යැයි පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්. අසංක වාසළ මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්. රූපසේන මැතිතුමා ස්ථිර කරන ලදී.

**<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>**

අතුරු ව්‍යවස්ථාවෙහි පොදු වෙළඳපල කඩ කාමර වලින් මාසික බදු මුදල ගෙවීමට ප්‍රමාද වන දිනයන් සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීම පිළිබඳව සඳහන් වුවද මාළු වෙළඳසැල් සඳහා ප්‍රමාදවන දිනයන් සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීම සම්බන්ධව සටහන්ව නොමැත. නමුත් අදාළ බදුකරු සමඟ ගිවිසගෙන ඇති ගිවිසුම් පත්‍රයෙහි මාසික කුලිය ගෙවීමට ප්‍රමාද වන දිනයන් සඳහා අයකරන ප්‍රමාද ගාස්තුවක් සඳහන්ව ඇති බැවින් එම්.එච්.එම්.නසීර් මහතාගේ ඉල්ලීම පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට ඉදිරිපත් කළයුතු බව පැවසීය.

එම්.එච්.එම්.නසීර් මහතා විසින් සිදුකර ඇති ප්‍රමාද ගාස්තු කපා හරින ලෙස කර ඇති ඉල්ලීම ,පළාත් පාලන කොමසාරිස්තුමා වෙත ඉදිරිපත් කර ඇති බැවින් මේ වන තෙක් ගෙවීමට ඇති ප්‍රමාද ගාස්තු මුදල ඒ ආකාරයෙන්ම තිබියදී මාසික කුලිය නිසියාකාරව ඉදිරියට ගෙවාගෙන යන ලෙසත් , මාසික බදු

කුලිය මාස තුනක් අඛණ්ඩව නොගෙවීමට කටයුතු කළහොත් වෙළඳසැලට මුද්‍රා තබන බවත්, පළාත් පාලන කොමසාරිස්තුමා විසින් එම ප්‍රමාද ගාස්තු අය කරන ලෙස නිර්දේශ කළහොත් එම ගාස්තුව ප්‍රාදේශීය සභාවට ගෙවීම් කළයුතු බවත් දන්වා එම්.එච්.එම්.නසීර් මහතා හට දැනුම් දියයුතු බවත් පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

අංක 01 එළ ගවමස් ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන එම්.එච්.එම්.නසීර් මහතා විසින් ,2026 ජනවාරි මාසයේ සිට 2026 මැයි මාසය දක්වා ගෙවීමට ඇති ප්‍රමාද ගාස්තුව වන රු.1,046,490.65 ක මුදල කපා හැරීම සඳහා පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමටත් , ප්‍රමාද ගාස්තු කපා හරින ලෙස ඉල්ලීම් කර ඇති එම්.එච්.එම්. නසීර් මහතා හට ඔහු විසින් කර ඇත ඉල්ලීම පළාත් පාලන කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇති බවත් මේ වන තෙක් ගෙවීමට ඇති ප්‍රමාද ගාස්තුව ඒ ආකාරයෙන්ම තිබියදී මාසික කුලිය නිසියාකාරව ගෙවන ලෙසත් අඛණ්ඩව මාස තුනක් ගෙවීම් නොකළහොත් වෙළඳසැලට මුද්‍රා තබන බවත් පළාත්පාලන කොමසාරිස් විසින් ප්‍රමාද ගාස්තු ගෙවීමට නිර්දේශ කළහොත් ගෙවීම් කිරීමට සිදුවන බවත් දන්වා අංක 01 එළගව මස් ව්‍යාපාරයේ බදුකරු වන එම්.එච්.එම්. නසීර් මහතා වෙත දන්වා යැවීමට තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.14.පිටකුඹුර සතිපොළෙහි බදු අයකිරීමේදී මතුව ඇති ගැටලු සම්බන්ධවයි.**

2026 වර්ෂයේ පිටකුඹුර සතිපොළ බදු ලබාගෙන ඇති බිබිල, ඇකිරියන්කුඹුර, කනවේගල්ල, පදිංචි ටී.බී.ගුණවර්ධන මහතා විසින් පිටකුඹුර සතිපොළ පවත්වාගෙන යාමේදී පහත ගැටළු වලට මුහුණදීමට සිදුවන බව දන්වා එවා ඇත.

- සතිපොළ වෙළඳාම් කටයුතු කරන වෙළඳ ප්‍රජාව බදු මුදල් නොදී කලහකාරී ලෙස බැන වැදීම. මෙම සතිපොළ බිබිල ප්‍රාදේශීය සභාවට අයත් නොවන බවත් වර්ල්ඩ් විෂන් ආයතනය මගින් ඉදිකළ බවත් ප්‍රකාශ කරමින් ඔවුන් දිගින් දිගටම බදු මුදල් ලබාදීම ප්‍රතික්ෂේප කරයි. මේ නිසා ප්‍රාදේශීය සභාවට මාසික බදු මුදල් ගෙවීමේදී ඉතාමත් අපහසුතාවයට පත්වීම.
- සතිපොළෙහි කසළ ඉවත් කිරීම හෝ සනීපාරක්ෂක කටයුතු නිසි පරිදි සිදු නොවීම හේතුවෙන් වෙළඳ ප්‍රජාවගේ දෝෂාරෝපණයට ලක්වීම.
- ජලය හා වැසිකිලි පහසුකම් නොමැතිවීම.

උක්ත ගැටළු හේතුවෙන් සතිපොළෙහි බදු මුදල් අයකිරීම ගැටළු සහගත බව දන්වා ඇති බැවින් මේ පිළිබඳව සාකච්ඡා කර තීරණයක් ලබා ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී. ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා

පිටකුඹුර සතිපොල පිහිටා තිබෙන්නේ තමාගේ කොට්ඨාසයේ බවත් මෙම බදුකරු විසින් දන්වා ඇති ගැටලු පවතී නම්, මීට පෙර සතිපොළ පවත්වාගෙන ගිය දම්සිරිගම ප්‍රජාශාලාව අසළ බිබිල ප්‍රාදේශීය

ලේකම්තුමාට අයිති ඉඩම් කොටස සතිපොළ පැවැත්වීමට සුදුසු ආකාරයට සංවර්ධනය කර එම ස්ථානයෙහි සතිපොළ ආරම්භ කිරීමට සුදුසු බවත්, බිබිල ප්‍රාදේශීය සභාව මගින්ම පොළ කාසි එකතු කරමින් පවත්වාගෙන යාමට සුදුසු බව පැවසීය.

**<u>ගරු මන්ත්‍රී පී.කේ.ඩී. රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා</u>**

මෙම සතිපොළට බඩු රැගෙන එන ජනතාව ගොවි ජනතාව බවත් ඔවුන් විසින් වගා කරනු ලබන අස්වැන්න මිලදී ගැනීම ගමෙන් බිහි වූ තොග වෙළඳුන් ඉදිරිපත් වීම නිසා සතිපොළට බඩු ගෙන ඒම අඩු වී ඇති බව පැවසීය. සතිපොළට බඩු ගෙන ඒමට ජනතාවට වාහන සඳහා මුදල් ගෙවමින් ප්‍රවාහන වියදම් දරමින් ඉතා අපහසුවෙන් තමාගේ කාලය වැය කරමින් එනවාට වඩා නිවසේ සිටම බඩු අලෙවි කිරීම ජනතාවට වාසි හා පහසු බැවින් නිවසේ සිටම බඩු අලෙවි කිරීමට පෙළඹී ඇති බව පැවසීය.

ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා පැවසූ දම්සිරිගම ස්ථානය ප්‍රධාන පාරින් බැහැරව ඇතුළත පිහිටා තිබීම නිසා එම ස්ථානයට වඩා පාසල, තැපැල් කාර්යාලය, පොලීසිය පිහිටා තිබීම මෙන්ම හතරමං හන්දියක් බැවින් දැන් පවත්වාගෙන යන ස්ථානය වඩාත් සුදුසු බව පැවසීය. සතිපොළෙහි වැසිකිළි දෙකක් ඉදිකර ජල පහසුකම් ලබාදෙන්නේ නම් ප්‍රශ්නය විසදෙන බවත් පෙ.ව. 9.00 පමණ වන තෙක් පොළ පවතින බැවින් පාසලට හා තැපැල් කාර්යාලයට පැමිණෙන පුද්ගලයින් මෙම පොළට පැමිණෙන බැවින් දම්සිරිගම ප්‍රජාශාලාව අසලට ගෙන යනවාට වඩා පවත්වන ස්ථානය ම සුදුසු බව පැවසීය.

මේ වනවිට සෑම නිවසකම වාහනයක් තිබෙන බැවින් බිබිල නගරයටම පැමිණ භාණ්ඩ අලෙවි කිරීමට ජනතාව පුරුදුව ඇති බැවින් පිටකුඹුර සතිපොළ ගැනුම් විකුණුම් අඩුවී ඇති බවත් එම තත්වය නිසා ගැනුම්කරුවන් (ව්‍යාපාරිකයන්) සතිපොළට පැමිණීමට මැලිව ඇති බවද පැවසීය.

**<u>ගරු සභාපති වි.සරත් විදානගම මැතිතුමා</u>**

2026 වර්ෂය සඳහා පිටකුඹුර සතිපොළ බදු ගෙන ඇති ටී.බී. ගුණවර්ධන මහතා හට සතිපොළ වෙළඳුන් බදු මුදල් ලබා නොදෙන බවත් සනීපාරක්ෂක, ජල, වැසිකිළි පහසුකම් නොමැති බව වැනි ගැටලු පවතින බවත්, ප්‍රතිසංස්කරණ කටයුතු කිහිපයක් සිදුකර දෙන ලෙසත් මැසිවිලි නගන බව පැවසීය. මෙම බදුකරුට ප්‍රාදේශීය සභාවට කුලී මුදල් ගෙවීමට නොහැකි තත්වයකට පත්ව ඇති බව දන්වා ඇති බවත් මේ සඳහා සභාවට තීරණ දෙකක් ලබාගත හැකි බව පැවසීය.

01. සභාවේ නිළධාරීන් කිහිප දෙනෙකු හා සේවක මහතුන් කිහිප දෙනෙකු එක්ව සතිපොළට ගොස් බදුකරුට සහයෝගය ලබා දෙන ලෙස දැනුවත් කිරීම් කර බදු මුදල් අය කර ගැනීමට බදුකරුට සහයෝගය ලබාදීම.

02. බදුකරුට බදු මුදල් ගෙවීමට නොහැකි තත්වයක් තිබේ නම් ප්‍රාදේශීය සභාවට භාරගෙන සභාවේ සේවක මහතුන් යොදවා පොළ කාසි එකතු කිරීම.

මෙම සතිපොළ බදුකරුගේ ඉල්ලීම පරිදි විශාල ලෙස සංවර්ධනයක් කිරීමේ ශක්තියක් බිබිල ප්‍රාදේශීය සභාවට නොමැති වුවත් මෙම සතිපොළ සංවර්ධනය කිරීම සඳහා Clean Sri Lanka වැඩ සටහනෙන් රුපියල් මිලියන 9ක් වෙන්ව ඇති බවත් පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු ආදායම් පරීක්ෂක මහතා සහ නිළධාරීන් කිහිප දෙනෙකු එක්ව දින කිහිපයක් සති පොළට ගොස් කුලී මුදල් ගෙවන්නන් දැනුවත් කිරීම් කර ඒ අයට බදුකුලී ගෙවීමට

පෙළඹවීම් කර බදු එකතු කිරීමට පිටකුඹුර සතිපොළ බදු ගෙන ඇති ටී.බී. ගුණවර්ධන මහතාට සහයෝගය ලබාදීමට හෝ සතිපොළ බදු ලබා ගෙන සිටින ටී.බී.ගුණවර්ධන මහතාට මාසික බදුකුලී මුදල ගෙවීමට නොහැකි නම් පිටකුඹුර සතිපොළ නැවත බිබිල ප්‍රාදේශීය සභාවට පවරා ගෙන ප්‍රාදේශීය සභාවේ කම්කරු මහතුන් යොදවා පොළ කාසි එකතු කිරීමේ කටයුතු සිදු කරමින් සතිපොළ පවත්වාගෙන යාමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඹ).01.15. දිට්වා සුළි කුණාටුවෙන් විපතට පත් දෙහිගල වත්ත මාර්ගය හා දේවාලය යථා තත්වයට පත් කිරීම සඳහා යෙදවූ මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ බැකෝ යන්ත්‍රය සඳහා වැය වූ ඉන්ධන වියදමේ ඉතිරි මුදල සහා අරමුදලින් ගෙවීම් කිරීම සම්බන්ධවයි.</u>**

දිට්වා සුළි කුණාටුවෙන් දෙහිගල වතු යායේ පිවිසුම් මාර්ගය , දේවාලය හා එහි පදිංචි ප්‍රජාවට හානි සිදුවී ඇත. මීගහකිවුල ප්‍රාදේශීය සභාව විසින් දෙහිගලවත්ත මාර්ගය හා දේවාලය නායයෑම යථා තත්වයට පත් කිරීම සඳහා බැකෝ යන්ත්‍රය යොදවා ඇත. ඒ සඳහා ගෙවීමට ඇති ඉතිරි ඉන්ධන වියදම සහා අරමුදලින් ගෙවීමට ගරු ආණ්ඩුකාරතුමාගේ හා පළාත් පාලන කොමසාරිස්තුමාගේ වාචික එකඟතාවය ලැබී ඇත. එම මුදල ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව සහා අරමුදලින් ගෙවීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ඩබ්.එම්.එම්.අසංක වාසළ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.කේ.ඩී.රෝහිත පුෂ්ප කුමාර මැතිතුමා</u>

මීගහකිවුල ප්‍රාදේශීය සභාව හා බිබිල ප්‍රාදේශීය සභාව එකම පළාත තුළ පිහිටා ඇති ප්‍රාදේශීය සභාවන් බැවින් මෙවැනි සේවාවක් සැපයීම් කර ඉන්ධන වියදම පියවා ගැනීමට මුදල් ලබාදීම නොකළයුතු බව පැවසීය. පුංචි ලෝකාන්තය පිහිටා ඇති භූමිය බිබිල ප්‍රාදේශීය සභාවට අයිති වුවද එම ස්ථානයට යන මාර්ගය ලුණුගල ප්‍රාදේශීය සභාවට අයිති වුවද එම ස්ථානයෙන් බදු අය කරනු ලබන්නේ මීගහකිවුල ප්‍රාදේශීය සභාව මගිනි. මෙලෙස ප්‍රාදේශීය සභාවන් එකිනෙක බැඳී පවතින බැවින් සාමූහිකව එකතුව සමාජ සේවාවන් සිදුකළ විට ඉන්ධන වියදම් පියවීම් කිරීම නොකළ යුතු බව පැවසීය.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

දිට්වා සුළි කුණාටුව සිදුවූ අවස්ථාවේ දෙහිගල වත්ත මාර්ගය හා එහි දේවාලය පස්වලින් යටි වී තිබුණ අතර දෙහිගලවත්ත ගම්වාසීන් විසින් දිට්වා සුළි කුණාටුවෙන් මාර්ගය හා දේවාලය පස්වලින් යටිව ඇති බැවින් එම පස් ඉවත් කර දෙන ලෙස බිබිල ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලීම් කර තිබුණු අතර එම කාලයේ එම දේවාලයේ සංස්කෘතික මංගල්‍යය සිදු කිරීමට ද අපේක්ෂිත වූ බැවින් කොළඹින් පැමිණි කණ්ඩායමක් විසින් පැය 6කට පමණ වැඩ කිරීමට මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ බැකෝ යන්ත්‍රය ගෙන්වා දෙන ලෙස බිබිල ප්‍රාදේශීය සභාවෙන් ඉල්ලා සිටින ලදී. ඒ අනුව බිබිල ප්‍රාදේශීය සභාවේ ඉල්ලීම මත මීගහකිවුල ප්‍රාදේශීය සභාවේ බැකෝ යන්ත්‍රය පැමිණ පස් ඉවත් කිරිමේ කටයුත්ත ආරම්භ කර ඇත.

එම කොළඹින් පැමිණි කණ්ඩායම විසින් පැය 6 සඳහා මුදල් ගෙවා තිබුණද පස් ඉවත් කිරීමේ කටයුත්ත එම කාල සීමාව තුළ සිදු කිරීමට නොහැකි විය. රු.90,000.00 ක මුදලින් ඉන්ධන ලබාදීමේ පොරොන්දුව මත බැකෝ යන්ත්‍රය පස් ඉවත් කිරීමේ කටයුතුවල නියුක්තව ඇති අතර එම කොළඹින්

පැමිණි කණ්ඩායම ඉන්ධන සඳහා රු.90,000.00ක මුදලක් ගෙවා ඇති අතර බැකෝ යන්ත්‍රයෙන් පස් ඉවත් කිරිමේ කටයුත්තට ඉන්ධන වියදම රු.90,000.00කට වඩා වැය වී ඇති බැවින් එම මුදල බිබිල ප්‍රාදේශීය සභාව මගින් ගෙවීම් කිරීමට පළාත් පාලන කොමසාරිස්තුමා හා ගරු ආණ්ඩුකාරතුමා විසින් වාචික එකගතාවය ප්‍රකාශ කර ඇති බැවින් එම මුදල් ගෙවීම් කිරීමට ගරු ආණ්ඩුකාරවර අනුමැතියට ඉදිරිපත් කර එම අනුමැතියට යටත්ව ගෙවීම් කළයුතු බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා</u>

දිට්වා සුළි කුණාටුව වෙනුවෙන් පන්සල් ,දේවාල කටයුතු සඳහා ගෙවීම් කිරීමට ලිඛිත අවසරයක් තිබේදැයි ගරු මූලාසනයෙන් විමසූ අතර පනත ප්‍රකාරව මේ සඳහා වැයකළ හැක්කේ රු.1000.00ක මුදලක් පමණක් යැයි පැවසීය. එසේම මෙම යෝජනාවෙහි ගෙවීමට ඇති මුදලක් සටහන්ව නොමැති බවත් එබැවින් එකගතාවය පලකළ නොහැකි බවත් පැවසීය. මීගහකිවුල ප්‍රාදේශීය සභාව මගින් ගෙවීමට ඇති මුදල ලිඛිතව ලබාගෙන පළාත් පාලන කොමසාරිස්තුමා හා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලිඛිතව ලබා ගෙන ගෙවීම් කිරීමට කටයුතු කරමු යැයි තමාගේ පෞද්ගලික අදහස බව පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

දෙහිගලවත්ත මාර්ගය හා දේවාලය අවට පස් ඉවත් කිරීම සඳහා මීගහ කිවුල ප්‍රාදේශිය සභාවේ බැකෝ ලෝඩර් යන්ත්‍රයට ඉන්ධන සඳහා වැයවූ මුදල හා ගෙවීම් කර ඇති මුදල හා දැනට ගෙවීමට ඉතිරිව ඇති මුදල් ප්‍රමාණය පිළිබඳව ලිඛිත වාර්තාවක් ඉල්ලා මීගහකිවුල ප්‍රාදේශීය සභාවට ලිපියක් යැවීමට කටයුතු කර එම වාර්තාව ලැබුණු පසු නැවත මහ සභාවකට ඉදිරිපත් කරන ලෙස තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

<u>**(ඉ).01.16. 2026 වර්ෂයේ ඉදිරි කාල සීමාව සඳහා කණුල්වෙළ එළ ගවමස් වෙළඳසැල බදු ලබාදීම සම්බන්ධවයි.**</u>

කණුල්වෙල එළගවමස් වෙළඳසැලහි බදු කාලසීමාව 2026.05.31 දිනෙන් අවසන් වේ. ඒ අනුව 2026.06.01 සිට 2026 .12.31 දක්වා වන මාස 06 ක කාල සීමාවක් සඳහා නැවත බදු ලබාදීම සිදුකළ යුතුවේ.

කණුල්වෙල ප්‍රදේශයේ එළගවමස් වෙළඳසැලක් සඳහා කඩ කාමරයක් බදු ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කර එම්.ආර්.තාජුදීන් මහතා විසින් මෙම සභාව වෙත ලිපි කිහිපයක්ම යොමු කර තිබුණි. ඒ අනුව සභාව ස්ථානීය පරික්ෂාවක් සිදුකරන ලදි. එහිදී එම කඩකාමරය සුදුසු ප්‍රමිතියට අනුව සකස් කර නැති බවත් එය නිසි පරිදි සකස් කරන ලෙසත් ඒ මහතා දැනුවත් කරන ලදි. එම්.ආර්.තාජුදින් මහතා විසින්

2026.01.11 ලෙස දිනය සටහන් කර තිබූ නමුත් එම ලිපිය මෙම කාර්යාලයට ලැබී ඇත්තේ 2026.03.17 දිනයි. එම ලිපිය මගින්ද මස් කඩයක් ලබා දීමට කැමති බව දන්වා ඇත. එම කඩකාමරය අප වෙත ලබා දීමට සූදානම් නම් එහි අයිතිය තහවුරු කරන ලිපි ලේඛන මෙම සභාව වෙත ඉදිරිපත් කරන ලෙසත් අතුරු ව්‍යවස්ථාවෙහි සඳහන් ප්‍රමිතියට අනුව එම කඩ කාමරය සකස් කර අප දැනුවත් කරන ලෙසත් දන්වා 2026.04.02 දිනැතිව ලිපියක් යොමුකරන ලදි.

නමුත් මේ වන තෙක් එම කඩකාමරය ලබාදීම සම්බන්ධයෙන් ඒ මහතා විසින් අයිතිය තහවුරු කිරීමක් හෝ කඩකාමරය මස් අලෙවියට සුදුසු පරිදි සකස් කළ බවක් හෝ අප වෙත දන්වා නොමැත.

ඒ අනුව කණුල්වෙල ප්‍රදේශයේ එළගව මස් කඩයක් විවෘත කිරීම සඳහා සුදුසු කඩ කාමරයක් අප හට මෙතෙක් සොයාගත නොහැකි වූ බැවින් දැනට කණුල්වෙල ප්‍රදේශයේ එළගව මස් වෙළඳසැල පත්වාගෙන යනු ලබන එච්.එම්.ඒ. මුනාෆ් මහතා හටම වසරේ ඉදිරි කාලසීමාව සඳහා එම වෙළඳසැල බදු ලබා දීම සුදුසු බව යෝජනා කරන අතර ඒ පිළිබඳව සාකච්ඡා කර සුදුසු තීරණයක් ගන්නා ලෙස මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී බී.එම් වීරසේකර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා</u>

පසුගිය කාලයේ කණුල්වෙල එළ ගවමස් විකිණීම සඳහා නොමිලේ කඩ කාමරයක් ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කර කණුල්වෙල එම්.ආර්.තාජුදීන් මහතා විසින් ලිඛිතව ඉල්ලීමක් සිදුකර තිබූ බවත් පසුගිය සභාවාරයකදී එම කඩ කාමරය පිළිබඳව ස්ථානීය පරීක්ෂාවක් සිදුකරන බව පවසා මාස තුනක කාලය අවසන් වීමට සතියකට පෙර එම ස්ථානයට ගොස් එම ස්ථානය සුදුසු නොවන බව පවසා එච්.එම්.ඒ. මුනාෆ් මහතාටම මාස දෙකකට දීර්ඝ කර එළගවමස් වෙළඳසැල බදු දුන් බව පැවසීය. මාස තුනක කාලසීමාවක් කඩ කාමර පරීක්ෂාවට අවස්ථාව තිබුණු බැවින් මුල් මාසයේම එම කඩ කාමරය පරීක්ෂා කර බලා එය නියම ප්‍රමිතියකට අනුව ඉදිකරන ලෙස දැන්වූයේ නම් එම මහතා ප්‍රමිතියට අනුව කඩ කාමරය ඉදි කරනු ඇතැයි පැවසීය. මෙය සිතාමතා කල් යැවීමේ කටයුත්ත සිදු කළ බවත් එම පුද්ගලයා විසින් රු.2,000,000.00ක මුදලකට එළගව මස් ව්‍යාපාරය බදු ගැනීමටද කැමැත්ත ප්‍රකාශ කළද මොනයම් හෝ හේතුවකට එම ව්‍යාපාරික මහතාට එළගව මස් ව්‍යාපාරය සිදු කිරීමට බදු ලබා නොදී දැන් සභාවට පාඩුවක් නොවන ආකාරයට එම්.එච්.ඒ.මුනාෆ් මහතාට ඉදිරි මාස 6ටත් බදු දෙමු යැයි කියා ඉල්ලීමක් කරනු ලබන්නේ එච්.එම්.ඒ මුනාෆ් මහතා ජාතික ජන බල වේගයට දේශපාලනමය වශයෙන් පසුගිය මැතිවරණයේදී ක්‍රියාකාරී සාමාජිකයෙකු ලෙස කටයුතු කළ නිසා බව පැවසීය.

ලක්ෂ 20කට බදු ගැනීමට ඉදිරිපත් වූ එම්.ආර්.තාජුදීන් මහතා විසින් තමාට අවශ්‍ය කාලයේදී එළ ගවමස් ව්‍යාපාරය බදු නොදුන් බැවින් නැවත සභාවට නොමිලේ කඩ කාමරයක් ලබා නොදෙන බවත් ටෙන්ඩර් මගින් බදු නොගන්නා බවත් තමා සමඟ පැවසූ බව පැවසීය. එබැවින් සභාවට ලබා ගැනීමට තිබූ ආදායම් අහිමි කර ගෙන ඇති බවත් වැඩි මුදලකට බදු ගැනීමට දැනට කිසිවකු ඉදිරිපත් නොවන බැවිනුත් දැනට ව්‍යාපාරය පවත්වාගෙන යන බදුකරුට ඉදිරි මාස 6ට ලබා නොදුනහොත් සභාවට ආදායම අහිමි වන බැවිනුත් එම්.එච්.එම්. මුනාෆ් මහතාටම ලබා දීමටම සිදුවන බව පැවසීය. නමුත් ප්‍රාදේශීය සභාවට හිමිවීමට තිබූ විශාල මුදලක් අහිමි කරගෙන එම්.එච්.ඒ.මුනාෆ් මහතාටම ලබාදීමට කටයුතු කිරීම පිළිබඳ තමා පෞද්ගලිකව කණගාටුව ප්‍රකාශ කරන බව පැවසීය.

ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා

ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා තම රාජකාරිය සඳහා ගමන් කිරීමේදී කණුල්වෙල ප්‍රදේශයට යන අවස්ථාවල නිතර නිතර අත්තනායක මැතිතුමාට අදහස් ප්‍රකාශ කරන සභාවට නොමිලේ කඩකාමරයක් ලබාදීමට ප්‍රකාශ කළ එම්.ආර්.තාජුදීන් මහතා නොමිලේ ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කර තිබූ කඩ කාමරය පරීක්ෂා කරන ලෙසත් පසුව ඉදිරි මස සභාවේ දී එම ස්ථානයේ එළගව මස් ව්‍යාපාරය පවත්වාගෙන යා හැකි ස්ථානයක් දැයි දන්වන ලෙස පැවසීය. ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා පවසන ආකාරයට ලක්ෂ 20ක මුදලට එළ ගව මස් ව්‍යාපාරය බදු ගනු ලබන්නේ නම් ප්‍රාදේශීය සභාවෙහි මුදල් උත්පාදනය ඉහළ ගොස් ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සිදු කිරීමට හැකි වන බවත් එම අදහස ඉතාමත් හොඳ වුවද තමාද ඊට කැමති වුවද මෙය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට නොහැකි බව පැවසීය. කඩකාමරය ප්‍රාදේශීය සභාවට ලබාදීමට කැමති පුද්ගලයා තමාගේ කඩ කාමරය ප්‍රතිසංස්කරණය කර වෙනත් ව්‍යාපාරයකට හෝ ලබා දෙන්නේ නම් වඩාත් සුදුසු බව පැවසීය. මෙම පුද්ගලයා සත්භාවයෙන් යුතුව සිදු කරන ක්‍රියාවක් නොව මෙය ගැටලු ඇති කිරීමට බලාපොරොත්තුවෙන් සිදුකරන ක්‍රියාවක් බව පැහැදිලි බව වැඩි දුරටත් පැවසීය.

බිබිල ප්‍රාදේශීය සභාවට අයිති භූමියක් කණුල්වෙල ප්‍රදේශයේ පවතිනවා යැයි කටකතාවක් පවතින බැවින් ඒ පිළිබඳව බිබිල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කර හඳුනා ගැනීමට කටයුතු කරන බවත් , ගරු මන්ත්‍රී ආර්.බී. අත්තනායක මැතිතුමා පවසන ආකාරයට එම්.එච්.ඒ.මුනාෆ් මහතා සමග කිසිදු රහස් සබදතාවයක් නොමැති බව පැවසීය. ඉදිරියේ දී විසඳුමක් ලැබෙන තෙක් 2026.06.01 සිට 2026 .12.31 දක්වා වන මාස 06 ක කාල සීමාවක් සඳහා දැනට එළ ගවමස් ව්‍යාපාරය පවත්වා ගෙන යනු ලබන එම්.එච්.ඒ.මුනාෆ් මහතා හට බදු දීමට සිදු වන බව පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**(ඉ).01.17. පුවක්පැලේ කසලාංගනයෙන් වැසි ජලය බැස යාමට කාණු පද්ධතිය සකස් කිරිම.**

2026.05.07 වන දින ඌව පළාත් පරිසර අධ්‍යක්ෂ, මොණරාගල පරිසර අධ්‍යක්ෂ, බිබිල සහකාර ප්‍රාදේශීය ලේකම්, බිබිල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි, බිබිල වන සංරක්ෂණ කාර්යාල නිළධාරීන් හා බිබිල පොලීසියේ පරිසර නිළධාරීන් සමඟ කරන ලද පුවක්පැලේ කසළ අංගනයේ නිරීක්ෂණ චාරිකාවෙන් පසු වාර්තාවක් එවා ඇති අතර එහි සඳහන් නිර්දේශ මාසයක් ඇතුළත සම්පූර්ණ කරන ලෙස දන්වා ඇත. ඒ අනුව වැසි ජලය බැස යාමට කඩිනමින් කාණු පද්ධතියක් සකස් කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**(ඉ).02. ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා**

**(ඉ).02.01. වකුගඩු රෝගී වාට්ටුවක් ස්ථාපිත කිරීම සම්බන්ධවයි.**

බිබිල මහාචාර්ය සේනක බිබිලේ අනුස්මරණ රෝහලේ දැනට වකුගඩු රෝගීන් 1000ක් පමණ ලියාපදිංචි වී ඇති අතර තවත් බොහෝ රෝගීන් වෙනත් රෝහල් වලින් ප්‍රතිකාර කරගනු ලැබේ. දැනට වකුගඩු පිළිබඳ විශේෂඥ වෛද්‍යවරයෙක් රෝහලේ සේවය කරන අතර එතුමාට අවශ්‍ය පහසුකම් රෝහලෙහි නොමැත. දැනට වැල්ලවාය හා සියඹලාණ්ඩුව රෝහල් වලද වකුගඩු රෝග වෛද්‍ය ඒකක පවත්වාගෙන යන අතර මූලික රෝහලක් වන බිබිල මහාචාර්ය සේනක බිබිලේ අනුස්මරණ රෝහලේද බොහෝ දුක් විඳින රෝගීන් වෙනුවෙන් වකුගඩු රෝගීන්ගේ රුධිර කාන්දු කරන වාට්ටුවක් ස්ථාපිත කිරීමට සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා</u>

බිබිල මහාචාර්ය සේනක බිබිලේ අනුස්මරණ රෝහලේ වකුගඩු රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය වරයා විසින් තමා හට වකුගඩු රෝගී රුධිර කාන්දු කරන වාට්ටුවක් ස්ථාපිත කිරීමට මන්ත්‍රීතුමා හා ප්‍රදේශයේ මන්ත්‍රීවරුන් ද එක්ව සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලුම් කළ බවත් විශේෂඥ වෛද්‍යවරයා කිහිප අවස්ථාවකම සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඉල්ලුම් කළද මේ පිළිබඳව අවධානය යොමු නොකළ බව තමා දැනුවත් කළ බව පැවසීය. තමා විසින් මේ පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශය හා ප්‍රදේශයේ මන්ත්‍රීවරුන් පස් දෙනාම දැනුවත් කළ බවත් වැල්ලවාය , සියඹලාණ්ඩුව වැනි කුඩා රෝහල්වල වකුගඩු රෝග වාට්ටු පවත්වාගෙන යන්නේ නම් වකුගඩු රෝගීන් විශාල ප්‍රමාණයක් සිටින බිබිල මූලික රෝහලේ මෙම වාට්ටුව ඇතිකර පහසුකම් සපයා දෙන ලෙස ඉල්ලුම් කළ බව පවසීය.

වකුගඩු රෝගීන්ගේ රුධිර කාන්දු කරන වාට්ටුවක් මහාචාර්ය සේනක බිබිලේ රෝහලේ ආරම්භ කිරීම සඳහා බිබිල ප්‍රාදේශීය සභාව මගින් ඉල්ලීම් කර ලිපියක් යැවීමට කටයුතු කරමු යැයි පැවසීය. බිබිලේ වකුගඩු රෝගීන් මුදල්, කාලය, ශ්‍රමය වැය කරගෙන මහියංගන , අම්පාර, බදුල්ල රෝහල් සඳහා යන බැවින් එම රෝගීන්ගේ සුබ විහරණය සඳහා මෙම සත්කාරය සිදු කිරීමට කටයුතු කරමු යැයි පැවසීය.

අයර්ලන්තයේ සිට වකුගඩු රෝගය පිළිබඳ වෛද්‍යවරයෙක් ලංකාවට පැමිණ සිටින බවත් එතුමා ලංකාවේ කිහිප තැනකම රැස්වීම් පවත්වමින් වකුගඩු රෝගීන් හඳුනා ගෙන වැහි ජල ටැංකි ලබාදීමට කටයුතු කරන බවත් තමන් හා නාමල් සහෝදරයාගේ මැදිහත් වීමෙන් බිබිල ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේ දී මැයි 17 වනදා සවස 2.00ට රැස්වීමට නියමිත බවත් ඒ සඳහා ගරු මන්ත්‍රී මණ්ඩලය සහභාගි වන ලෙසත් ඉල්ලා සිටි අතර මේ සඳහා ප්‍රජා ශක්ති සංවිධානවල සභාපතිවරුන්ටද සහභාගි වන ලෙස දන්වා ඇති බවත් පැවසීය.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාද අවස්ථාව අවසන් බව මූලාසනය විසින් ගරු සභාවට දැනුම් දෙන ලදී.

බිබිල මහාචාර්ය සේනක බිබිලේ අනුස්මරණ රෝහලේ වකුගඩු රෝගීන්ගේ රුධිර කාන්දු කරන වාට්ටුවක් ස්ථාපිත කිරීම සඳහා බිබිල ප්‍රාදේශීය සභාව මගින් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත දැනුවත්

කිරීමට සුදුසු බව තීරණය කරන ලදී.

අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව හා තීරණය සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඉ).02.02. මාර්ග සංවර්ධනය පිණිස බඳු පදනම මත යන්ත්‍ර ලබා ගැනීම සම්බන්ධවයි.</u>**

බිබිල බල ප්‍රදේශය තුළ ඇති මාර්ග සංවර්ධනය කිරීම පිණිස සභාවේ ඇති යන්ත්‍ර හා වාහන ප්‍රමාණවත් නොවීමත් අබලන් තත්වයේ තිබීමත් හේතුවෙන් ,

- මොටර් ග්‍රේඩරය
- බැකෝ ලෝඩර් යන්ත්‍රය
- ටිපර් යන්ත්‍රය
- තැලුම් යන්ත්‍රය
- ස්කවේටරය

යන යන්ත්‍ර සූත්‍ර අවශ්‍ය අවස්ථාවකදී බදු පදනම මත ලබා ගැනීමට අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

අදාළ යෝජනාව ගරු මන්ත්‍රී ආර්.බී.ප්‍රේමතිලක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් මූලාසනය විසින් ගරු සභාවට විවාද අවස්ථාව ලබාදෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් විවාදයක් සිදු නොවූ අතර මූලාසනය විසින් විවාද අවස්ථාව අවසන් බව ගරු සභාවට දැනුම් දෙන ලදී.

අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ එකඟතාවය විමසීය.

එහිදී අදාළ යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අසුන්ගෙන සිටි මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවය හිමිවූයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඊ). කාරක සභා වල වාර්තා ඉදිරිපත් කිරිම.</u>**

කිසිවක් ඉදිරිපත්වී නොමැත.

**<u>(උ).ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතුකල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම හා සලකා බැලීම.</u>**

2026 අප්‍රේල් මාසයට අදාල ලැබිම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ (ප්‍රා.ස. 16 හා ප්‍රා.ස. 14) සහ හිඟ ආදායම් පිළිබඳ විස්තර (ප්‍රා.ස. 07) ගරු සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදි.

ආදායම්

| | |
|---|---|
| පුනරාවර්තන ආදායම් | - රු. 8,893,960.22 |
| මූලධන ලැබීම් | - රු. - |
| ප්‍රාග්ධන ලැබීම් | - රු. - |
| වෙනත් ලැබීම් | - රු. 749,028.05 |
| මුළු ලැබීම් | - රු. 9,642,988.27 |

වියදම්

| | |
|---|---|
| පුනරාවර්තන වියදම් | - රු. 9,258,368.55 |
| ප්‍රාග්ධන වියදම් | - රු. - |
| ණය ආපසු ගෙවීම් | - රු. 213,221.04 |
| වෙනත් වියදම් | - රු. 1,202,845.67 |
| ආයෝජන | - රු. - |
| මුළු වියදම් | - රු. 10,674,435.26 |

**2026.04.30 දිනට තවදුරටත් හිග ආදායම් විස්තරය**

| | |
|---|---|
| වරිපනම් බදු | - රු. 23,486,869.88 |
| අක්කර බදු | - රු. 11,840.58 |
| ජල ගාස්තු නායකඳුර ජල යෝජනා ක්‍රමය | - රු. 2,275,027.00 |
| ජල ගාස්තු රතුපස්කැටිය ජල යෝජනා ක්‍රමය | - රු. 874,855.00 |
| කුලී මුදල් | - රු. 1,804,408.34 |
| ටෙන්ඩර් මඟින් කුලියට දීම් | - රු. 2,990,247.71 |
| එකතුව | - රු. 31,443,248.51 |

**(උ). වෙනත් කරුණු**

**ගරු මන්ත්‍රී පී.ජයන්ති මිය**

ග්‍රාමීය මාර්ග මෝටර් ග්‍රේඩර් කර දෙන ලෙසත්, මාර්ග දෙපස වල් වැවී මාර්ගය දෙසට පහත් වී ඇති බැවින් වල් කපා පවිත්‍ර කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

**ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා**

සභාව මගින් සවිකර ඇති වීථි ලාම්පු වල කප් වැටෙන බවත් මහජනතාව විසින් ඒ පිළිබඳව පැමිණිලි කරන බවත් එබැවින් ඒ පිළිබඳව සොයා බලා සකස් කළයුතු බව පැවසීය. ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට හා සභා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය සියළු දෙනාට හා පවුල්වල සියළුම දෙනාට උදාවන වෙසක් පොහොය දින උතුම් තෙමගුල සැමරීමට තෙරුවන්ගේ ආශිර්වාදය ප්‍රාර්ථනා කරන ලදී.

**ගරු මන්ත්‍රී ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය**

බිබිල ප්‍රාදේශීය සභාවේ තාවකාලික පදනම මත බඳවා ගෙන දැනට සේවයේ නියුක්ත කාර්ය මණ්ඩලය ස්ථිර කිරීම පිළිබඳව චක්‍රලේඛ තිබේද? යැයි ප්‍රශ්න කළ මන්ත්‍රීතුමිය එම සේවක මහතුන් ස්ථිර කිරීමේ කටයුතු සිදු කරමු යැයි පැවසීය.

බිබිල බස් නැවතුම්පොළේ කාණු පද්ධතිය තැනින් තැන කැඩී ගොස් විශාල වලවල් සෑදී තිබෙන බවත් එම ස්ථාන ඉතා අවදානම් බවත් පැවසූ අතර ඒ තුළට බුලත් කෙළ ගැසීම හේතුවෙන් රතුපාට වී තිබෙන

බවත් එබැවින් මෙම අවදානම් ස්ථාන අනතුරක් වීමට පෙර ඉක්මණින් සකස් කළයුතු බව පැවසීය.

බිබිල ප්‍රාදේශීය සභාවට අයත් බිබිල පෙර පාසලේ ඉදිරියේ ඇති සෙල්ලම් මිදුලේ ඉදිකර ඇති ගොඩනැගිල්ලෙහි වහලය දිරාපත් වී කඩා වැටී ඇති බවත් එය අවදානම් බැවින් එය හැකි ඉක්මණින් ඉදිකිරීමට කටයුතු කළයුතු බවත් මේ සඳහා ප්‍රාදේශීය සභාව මගින් මුදල් වෙන් කර ඇති බවත් පැවසීය.

මේ වනවිට බිබිල ආයුර්වේදය සංස්කෘතික මධ්‍යස්ථානයේ කොටසක පවත්වා ගෙන යන බවත් එම ස්ථානයේ ආයුර්වේදයක් පවත්වාගෙන යාමට සුදුසු වාතාවරණයක් නොමැති බැවින් සම්පත් මධ්‍යස්ථානයේ කොටසක් ලබාදීමට එකඟතාවයකට පැමිණ ඇති බැවින් එය හැකි ඉක්මණින් එම ස්ථානය වෙත ගෙන ගොස් ආරම්භ කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටින ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා</u>

ශ්‍රී ලංකාවේ මත්පැන්හල් ආරම්භ කිරීම පසුගිය ආණ්ඩු සමයෙහි ආරම්භ වූ බව සභාපතිතුමා පැවසුවද ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සමයෙහි කිසිදු මත්පැන්හලක් ආරම්භ නොකළ බවත් ගරු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණියගේ සමයේ හා පසුගිය ආණ්ඩුව මගින් මත්පැන්හල් ආරම්භ කළ බවත් ජාතික ජන බලවේග ආණ්ඩුව මගින් එම මත්පැන්හල්වල අවසරපත් තහනම් කිරීමට කටයුතු කරන බව පවසමින් රැස්වීම්වල හඬ නැගූවද මේ වනවිට මත්පැන්හල් ආරම්භ කිරීමට කැමැත්තක් දක්වන බව තමාට හැගීයන බව පැවසීය.

බිබිල ප්‍රාදේශීය සභාවේ කාර්ය මණ්ඩලයේ සේවක මහතුන්ට රැකියා තෘප්තිය අහිමිව ගොස් ඉල්ලා අස්වීම භාරදී ඇති බවත් තවත් කිහිප දෙනෙකුම ඉල්ලා අස්වීමේ ලිපි භාරදීමට බලාපොරොත්තුව සිටින බවත් සේවක මහතුන්ට රැකියාව එපාවී ඇති බවට මැසිවිලි නගන බවත් තමාට දැන ගැනීමට ලැබුණු බවත් ඒ පිළිබඳව කරුණු සොයා බැලීමේදී ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය හෝ ගරු සභා ලේකම්තුමියගේ ක්‍රියාකලාපයක් නිසා නොව පරිපාලන කටයුතුවල නිරත වන ඇතැම් නිළධාරීන්ගේ ක්‍රියා කලාපයන් නිසා බව පැවසීය. එම නිසා සභාවේ සේවක මහතුන් ඉල්ලා අස්වුවහොත් සභාව පවත්වාගෙන යාමට ඉතා අපහසු බවත් සභාවේ සේවක මහතුන් හට බලපෑම් කරමින් ඒ අයගේ රැකියාව එපා වීමට කටයුතු කරන්නේ නම් එය එතරම් සුභ නොවන බවත් පැවසීය. එබැවින් ඒ පිළිබඳව අවධානය යොමු කරන ලෙස ගරු මූලලාසනයෙන් ඉල්ලා සිටින ලදී.

සභාවේ සේවයේ නියුතු සමහර නිළධාරීන් වැරදි කළද ඒ අය පිළිබඳව පරීක්ෂණ කටයුතු නොකර සිටියි. කඩිනමින් ඒ අය පිළිබඳව විනය පරීක්ෂණයන් සිදුකර රාජකාරියක් ලබාදීමට හෝ එසේ නැතිනම් සේවයෙන් ඉවත් කිරීම හෝ කටයුතු කිරීම සුදුසු බව පැවසීය. ගරු සභාපතිතුමා හා සභා ලේකම්තුමිය එක්ව කාර්ය මණ්ඩලය පිළිබඳ අවධානය යොමු කර ඒ අයගේ ගැටලු පිළිබඳව අවබෝධ කරගෙන කටයුතු කරන්නේ නම් සුදුසු බව පවසා සිටින්නේ ප්‍රාදේශීය සභාවට සිදුවීමට තිබෙන අපකීර්තිය ලැබීමට පෙර බව පැවසීය.

<u>ගරු මන්ත්‍රී ඒ.එම්.ජානක නිමල් බණ්ඩාර මැතිතුමා</u>

2026 වර්ෂයේ බිල්කල ආදායම එකතු කිරීමේ ප්‍රගති වාර්තාව තුළ 2026 වර්ෂයේ (ජනවාරි සිට අප්‍රේල් දක්වා) බිල්කළ ආදායම රු.11,904,997.94ක් ලෙස සටහන්ව තිබෙන බවත් ඉන් එකතු කළ වරිපනම් ආදායම රු.2,639,313.23 ලෙස හා තවදුරටත් පවතින හිඟ මුදල රු.8,983,069.93 ක් ලෙස සටහන්ව තිබෙන බවත් 2026.01.01 දිනට හිඟ වරිපනම් බදු රු.16,256,774.43 ක් බවත් තවදුරටත් පවතින හිඟය රු.14,503,799.95 ක් බවත් දන්වා ඇති බැවින් මෙය ප්‍රශ්නයක් බවත් පැවසූ අතර බිබිල ප්‍රාදේශීය සභාව වරිපනම් බදු අය කරන්නේම නැත්දැයි විමසන ලදී. එතරම් විශාල වරිපනම් මුදලක් අයවීමට තිබීම ඉතා අසාර්ථක තත්වයක් බව පැවසීය.

අදාළ කරුණ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩී.එම්.ශ්‍රියාණි මංගලිකා ජයලත් මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

සාකච්ඡාවෙන් අනතුරුව කාරක සභාව නැවත මහ සභාවක් බවට පත්කිරීමේ යෝජනාව ගරු උප සභාපති එච්.එම්. අනුරසිරි ගුණසේකර මැතිතුමා විසින් සිදුකල අතර ගරු මන්ත්‍රී ඩබ්.එම්.රූපසේන මැතිතුමා ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති වී.සරත් විදානගම මැතිතුමා</u>

ගරු මන්ත්‍රී ආර්.බී.අත්තනායක මැතිතුමා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සමයෙහි මත්පැන් බලපත්‍ර නිකුත් නොකළ බව පැවසුවද ඒ පිළිබඳව හරියටම නොදන්නා බැවින් අදහසක් දැක්විය නොහැකි බවත් සංචාරක හෝටල්වල එනම් සියලු පහසුකම් සහිත කාමර 05ක් සහිත සංචාරක හෝටල් සඳහා සංචාරක මණ්ඩලය හරහා මත්පැන් බලපත්‍ර ලබා ගැනීමට හැකියාව තිබෙන බවත් ඒ අනුව බලන විට මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ සමයෙහි සංචාරක හෝටල් ද ආරම්භ නොවී ඇතැයි ද පැවසූ අතර බිබිල ප්‍රදේශයේ නම් එසමයෙහි මත්පැන් අලෙවිසැල් ආරම්භ නොවූ බවත් නීති විරෝධී තිප්පොලවල් කිහිපයක් තිබුණු බව පැවසීය.

සතොස යනු රාජ්‍ය ආයතනයක් බවත් මත්පැන් අලෙවි සැලක් සුරාබදු දෙපාර්තමේන්තුවේ නීති රෙගුලාසි වලට අනුකූලව පවත්වාගෙන යාමට අවසර ලැබෙන්නේ නම් ප්‍රාදේශීය සභාවක් ලෙස සීමා මායිම් පනවමින් බලපෑම් කිරීමට නොහැකි බව පැවසීය. කිසිම මත්පැන් අලෙවිසැලක් නිති රෙගුලාසි වලට යටත්ව පවත්වාගෙන යන්නේ නම් ඒවා කිසිවක් පවතින ආණ්ඩුවට අවලංගු කළ නොහැකි බවත් නීති විරෝධීව පවත්වාගෙන යනු ලබන මත්පැන් අලෙවිසැලක් වේ නම් ඒවායෙහි මත්පැන් බලපත්‍ර අහෝසි කළහැකි බව පැවසීය. බිබිල ප්‍රදේශයේ වුවද පවත්වාගෙන යනු ලබන මත්පැන් අලෙවිසැල් පන්සල් පාසල් වලට 500mක් දුරින් පිහිටා නොමැති බවත් ඒ කෙසේ වුවද අතීතයේ ආරම්භ කළ මෙම අලෙවිසැල් ඉවත් කිරීම අභියෝගයක් බව පැවසීය. පවත්නා රජය විසින් මත්පැන් අලෙවිසැල් මගින් විශාල බදු ආදායමක් ලබන බවත් මේ වනවිට ජාතික ජනබලවේග ආණ්ඩුව සුරා බදු හොරුන් විශාල ප්‍රමාණයක් නීතියේ රැහැනට හසු කරගෙන ඇති බවත් ඒ අයගෙන් එම බදු අය කරගෙන පෙරලා මහජන සේවය සඳහා යෙදවූ බවත් පැවසීය.

එළගව මස් ව්‍යාපාරය 2027 වර්ෂයේ ආරම්භ කිරීම සඳහා කඩ කාමරයක් ඉදිරියේදී සොයා ගෙන සභාව මගින්ම බදු දීමේ කටයුත්ත සිදුකළ යුතු බවත් අත්තනායක මැතිතුමා විසින් මේ සම්බන්ධයෙන් උත්සාහවන්තව කටයුතු කිරීම පිළිබඳ ව ප්‍රශංසා කරන ලදී.

සභාවේ සේවයේ නියුතු සෑම නිළධාරියෙකුටම යම් වගකීම් කාර්යයන් සම්භාරයක් පැවරී ඇති බවත් කම්කරු වෘත්තීන්ට බඳවා ගෙන ඇති එම වෘත්තියේම නියලෙන හෝ කම්කරු වෘත්තියේ වුවද වෙනත් කාර්යයන්වල නියුක්ත වන කම්කරු මහතුන් හට ද කිසියම් වෘත්තියක් තිබෙන බවත් තමන්ගේ වෘත්තිය නිශ්චිතව කිරීමට මග පෙන්වන නිළධාරි මහතුන් සිටින බව පැවසූ අතර උදාහරණයක් ලෙස සභා ලේකම්තුමිය තමා යටතේ සේවය කරන නිළධාරීන් හා සේවක මහතුන් තමන්ගේ වෘත්තිය කුමක්දැයි මග පෙන්වනු ලබන බව පැවසීය.

මෙම මග පෙන්වීම් සමහර නිළධාරීන්ට කර්කශ බව පැවසූ අතර ප්‍රාදේශීය සභාවක් තුළින් සිදුකළ යුතු කිසියම් කාර්ය භාරයක් පවතින බවත් එම කාර්ය භාරයන් ඉටු කිරීම සඳහා එහි සේවය කරන කාර්ය මණ්ඩලය සඳහා ඒ ඒ අයට ඉටුකළ යුතු වෘත්තියක් වගකීමක් තිබෙන බවත් ඒවා ඉටු කිරීම සඳහා බැඳී සිටිය යුතු බව පැවසීය. එසේ වෘත්තිය ඉටු කිරීමට බැඳී සිටි සේවක මහත්ම මහත්මීන්ගේ අසනීප තත්වයන් ශාරීරික මානසික අපහසුතාවන් හමුවේ ඒ අයට සහන ලබා දෙමින් කටයුතු කළ බව පැවසීය.

ගරු සභාපතිවරයාද සභා ලේකම්තුමියද කාර්යාලයක රැදී රාජකාරි ඉටු කරන බවත් නමුත් ක්ෂේත්‍රයේ රාජකාරි කටයුතු කරනු ලබන වෘත්තිකයින් සඳහා අවවාද ,මග පෙන්වීම් කරනු ලබන තවත් ක්ෂේත්‍ර නිළධාරීන්ද සිටින බවත් ඒ අයගේ මගපෙන්වීම් සිදු කිරීමට යෑමේදී කම්කරු සේවක මණ්ඩලය විසින් පැහැර හැරීමක් ,මැළිකමක් දක්වන බැවින් ඒ අයගේ රාජකාරි පැහැර හැරීම වෙනුවෙන් ක්ෂේත්‍ර නිළධාරීන්ට නීතිය ක්‍රියාත්මක කිරීමට සිදුවන බව පැවසීය. ඒ අවස්ථාවේ දී කෑගසා බැන ගනිමින් රණ්ඩු දබර කරමින් නොව නීතිය ක්‍රියාත්මක කළයුතු බවත් පැවසීය. නිළධාරීන් තමන්ට හිමි වගකීම් මොනවාදැයි පැහැදිලි කර දීමට යෑමේදී තමන් භාරගත් වගකීම කුමක්ද කියා පැහැදිලි කර දීම තමන් භාරගත් වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්නේ කොහොමදැයි කියාදීම , අනුගතවීම හා අනුගත නොවීම පිළිබඳව පැහැදිලි කර දීමට යෑමේදී ප්‍රශ්නයක් ගැටලුවක් මතුවන බව පැවසීය. මෙවැනි අවස්ථාවන් වලදී වචන හුවමාරුවීම් ආදිය තුළින් හිත් අමනාපකම් ඇතිවී ඇති බව හඳුනාගත් බවත් නමුත් ඒවාට ක්ෂණික තීරණ ගැනීමට හැකියාවක් නොමැති වුවද මේ සම්බන්ධ ලියුම් කියුම් වලින් කටයුතු කිරීමට සිදුවන බවත් පැවසීය. තමාට පැවරෙන වගකීම් වෘත්තිය ඉටු කිරීමට නොහැකි නම් ඉල්ලා අස්වීමේ ලිපි ලබාදී ඇති අයට රැකියාවෙන් ඉවත් වියහැකි බවත් එසේ නැතිනම් මග පෙන්වීම්වලට අනුව තමාගේ වෘත්තීයමය කාර්යයන් ඉටුකිරීමේ කටයුතු වල නියුක්ත වියහැකි බවත් පැවසීය.

යම්කිසි කාර්යක් ඉටු කිරීමේදී නිවැරදිව , නීත්‍යානුකූලව කටයුතු කළයුතු බවත් එසේ සිදු නොකළහොත් සභාපතිවරයාට ,සභා ලේකම්තුමියට රාජකාරි කිරීමට නොහැකි වන බවත් ගරු මන්ත්‍රී මණ්ඩලයට ද මහජනතාව සඳහා වගකීම් ඉටු කිරීමට නොහැකි වන බවත් පැවසීය.

නව වරිපනම් තක්සේරුව සමඟ වාර්ෂික වරිපනම් ගාස්තුව ඉහළයාම නිසා ව්‍යාපාරික මහතුන් මහජනතාව එකවිටම ගෙවීම් කිරීම නවතා ඇති බව හඳුනා ගන්නා බවත් මේ පුද්ගලයින් මීට වසර 14කට පෙරට වඩා මේ වනවිට බිබිල නගරය දියුණුව ඇති බව අවබෝධ කර නොගෙන ඇති බැවින් ඒ අය මෙම මුදල ගෙවීමට එකඟ වී නොමැති බවත් පැවසීය. භෞතික වශයෙන් මෙන්ම පුද්ගලයන් වශයෙන් මහජනතාව දියුණු වී ඇති බවත් ගෙවීමට යම් කිසි මුදලක් වැඩි වුවහොත් ඊට විරෝධය පෑමට හුරුව ඇති ජනතාවක් සිටින බැවින් ජනතාව තුළ නිවැරදි දැක්මක් ඇති කළයුතු බව පැවසීය.

ශ්‍රී ලංකාවට වඩා සංවර්ධනය අතින් පහත් මට්ටමින් සිටි සිංගප්පූරුව, මාලදිවයින වැනි රටවල් මේ වනවිට ඉහළ සංවර්ධන මට්ටමට පත්ව ඇත්තේ ජනතාවගේ ආකල්ප වැඩිදියුණු වීමෙන් බවත් එබැවින් ශ්‍රී ලංකාව තුළද ජනතාවගේ ආකල්ප දියුණු කිරීමේ කටයුතු සිදුකළයුතු බවත් අපගේ අනාගත පරපුර සඳහා සුදුසු රටක් බිහි කිරීමට කවුරුන් හෝ මැදිහත් වියයුතු බව පැවසීය.

මේ වන විට බිබිල ප්‍රාදේශීය සභාවේ ආදායමට වඩා වියදම වැඩි වී ඇති බවත් එයට හේතුව ලැබීමට ඇති වරිපනම් ආදී විවිධ ආදායම් එකතු නොවීමත් ඉන්ධන පිරිවැය ආදී විවිධ වැය තිබුණු ප්‍රමාණයට වඩා වැඩිවීම නිසා බව පැවසීය. මේ වනවිට ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරීමට ඇස්තමේන්තු කර ඇති මුදල මේ වනවිට එම සංවර්ධන යෝජනාව ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් නොවන බැවින් එම ව්‍යාපෘතියේ ප්‍රමාණය කුඩා කිරීමට දැනුම් දී ඇති බවයි. භාණ්ඩ මිල වැඩිවීම පොදුවේ සියළු දෙනාට දරා ගැනීමට සිදුවන්නාක් මෙන්ම බිබිල ප්‍රාදේශීය සභාවටද දරා ගැනීමට සිදුවන බවද පැවසීය. මේ වෙනස් වීම් හමුවේ සභාවේ මන්ත්‍රී මණ්ඩලය මෙන්ම කාර්ය මණ්ඩලයට සමාජයේ ආර්ථික තත්වය තේරුම් ගෙන දරා ගතයුතු වන්නාක් මෙන්ම තමාට පැවරෙන රාජකාරිය නොපිරිහෙලා ඉටු කළයුතු බව පැවසූ අතර මේවා දරා ගැනීමට නොහැකිව කලකිරීමට පත්වන අයට තමාගේ කැමැත්ත අනුව රැකියාවෙන් ඉවත්ව යාමට හැකි බව පැවසීය. තමාගේ වෘත්තියට සරිලන ලෙස රාජකාරිය පැවරීමට සිදුවන බවත් තමන්ගේ කැමැත්ත අනුව කටයුතු කරන ලෙස වැඩ නොකර තෝරා බේරා රඳවා තබා ගැනීමට සභාවක් ලෙස කළ නොහැකි බව පැවසීය.

සභා ලේකම්තුමිය මෙන්ම සභාපති වරයා ලෙස තමාද කාර්ය මණ්ඩලයේ කිසිදු අයෙකුට සිත්සතන් පීඩාවට පත් කර කටයුතු නොකරන බවත් නමුත් නීතියේ වචනයට පරිසමාප්ත අර්ථයෙන් අනුගත වී වැඩ කරන නිළධාරියෙක් සිටී නම් එසේ වැඩ කරන නිළධාරියෙකුට එසේ නීතියට අනුව වැඩ නොකරන ලෙස නීතියේ සීමාව සැර වැඩියි යැයි කීමට නොහැකි බවත් පැවසීය. හොරකම් නොකරන

නිවැරදිව වැඩ කරන තමන්ගේ සේවාව දේව කාරියක් ලෙස ඉටු කරන නිළධාරීන් සේවයෙන් පරිභාහිරව පුද්ගලික ලාභ ප්‍රයෝජන නොමැතිව වැඩ කරන අයට එම කාර්ය ඉටු කිරීමට මග නොඅහුරන බව පැවසීය. ඒ අය නිසා සමාජය හැදෙන බවත් වැඩ නොකරන ආපස්සට අදින සමාජය විනාශය කරා රැගෙන යන සමාජයේ සිටින පුරවැසියන්ටත් සමගම වැඩ කරන බවත් වෙහෙස නොබලා , විවේක නොගෙන කෑමක් බීමක් වත් හරියට නොගෙන තමන් ගන්නා පඩියට වඩා සිය ගුණයකට වැඩ කරන්නේ කුසීත කම්මැලි මිනිසුන්ගේ දරුවන්ටත් සමගම බව තවදුරටත් පැවසීය. එලෙස වැඩ කරන නිළධාරීන්ට තමාගේ නීතිය ක්‍රියාත්මක කිරීමට විරුද්ධව කටයුතු කළ නොහැකි බව පැවසීය.

ගරු මූලාසනය විසින් 2026 මැයි මස මහ සභාව සඳහා සහභාගි වූ සියළු දෙනා හට ස්තූතිය ප්‍රකාශ කරමින් එළඹෙන වෙසක් උත්සවයට හා නබිනායකතුමාගේ උපන් දිනය සැමරීම වෙනුවෙන් සුභ පතමින් 2026 ජුනි මසට අදාළ මහ සභා රැස්වීම සියළු දෙනාගේ එකඟතාවය මස ජුනි 19 වන දින පෙ.ව. 9.30 ට සභා රැස්වීම් ශාලාවේදී රැස්වන බව දැනුම් දීමෙන් අනතුරුව මැයි මස මාසික මහ සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වී.සරත් විදානගම,
සභාපති,
බිබිල ප්‍රාදේශීය සභාව.

පිටපත් -

01. පළාත් පාලන කොමසාරිස්, බදුල්ල. - කා.දැ.ගැ.පි.
02. පළාත් පාලන සහකාර කොමසාරිස්, මොණරාගල. - කා.දැ.ගැ.පි.
03.විගණන අධිකාරි, ජාතික විගණන උප කාර්යාලය, හුලංදාව,මොණරාගල - කා.දැ.ගැ.පි